*සැ. යු. -* 2026.06.26 පළවූ 2495 *ගැසට් පත්‍රයේ* I කොටස III ඡේදය පළනොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,496 - 2026 ජූලි මස 03 සිකුරාදා - 2026.07.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස : II (ආ) ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 2934 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 2935 |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... | 2942 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 2946 |

*සැ. යු. -* ශ්‍රී ලංකා කැල්වරි දේවස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත 2026.06.26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 24 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 10 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට්* පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහජන බැංකුව - වාද්දුව ශාඛාව**

මහජන බැංකුව විසින් අත්කරගනු ලැබූ කඩවත ඉහළ බියන්විල මහනුවර පාරෙහි අංක 1258 දරන වටිනා දේපළක් විකිණීම සඳහා මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.
(ප්‍රමාණය : රූ. 1, පර්. 0.15)

1. මහජන බැංකුවේ කළුතර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය කළමණාකරු වෙතින් ලබාගත් අයදුම්පතක් මගින් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

2. ආපසු නොගෙවන රුපියල් 3000.00 ක මුදලක් ගෙවීමෙන් පසු පානදුර, ගාළු පාර, අංක 341 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුවේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය කළමණාකරු විසින් 2026.07.17 දින දක්වා සතියේ වැඩ කරන දින වල පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා කාලය තුළ මිල ගණන කැඳවීමට අදාළ අයදුම්පත් නිකුත් කරනු ලැබේ.

3. එක් එක් ටෙන්ඩර් පතක් වෙනුවෙන් වාද්දුව ශාඛාවෙහි අංක 262100232473892 දරන රුස්කිරීමේ ගිණුමෙහි බැරට රුපියල් 100,000.00 ක මුදලක් ද මහජන බැංකුවෙහි ඕනෑම ශාඛාවක් මගින් වැඩිදුරටත් තැන්පත්කළ යුතුය. ලැබුණු ටෙන්ඩර්පත් ඇගයීමෙන් පසු අසාර්ථක ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ. තෝරාගනු ලබන ඉහළම මිල ගණන් ඉදිරිපත් කළ අයදුම්කරුවන් වෙත අයදුම්පත පිළිගත්බව දැනුම්දීමෙන් දින 10 ක් ඇතුළත අර්පණය කළ මුදලින් 25% ක මුදලක් අත්තිකාරම් ලෙස ද පිළිගැනීම් ලිපියේ දින සිට දින 30 ක් තුළ ඉතිරි මුදල සම්පූර්ණයෙන් ද ගෙවා නිම කළ යුතුය. සියලුම ගෙවීම් අංක 262100 232473892 දරන රුස්කිරීමේ ගිණුමෙහි බැරට සිදු කළ යුතුය.

4. ටෙන්ඩර් අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර අත්සන් තබා මුද්‍රා තැබූ කවරයක බහා "කඩවත දේපළ මිල දී ගැනීම සඳහා මිල ගණන්" යනුවෙන් ටෙන්ඩර්පත බහාලූ කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි සඳහන් කර 2026.07.20 දින පස්වරු 3.00 ට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් පානදුර, ගාළු පාර, අංක 341 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුවේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත එවීම හෝ 2026.07.20 දින පස්වරු 3.00 ට පෙර ඉහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කිරීම සිදු කළ යුතුය. තැන්පතුව සඳහා අදාළ ලදුපතේ මුල් පිටපත ටෙන්ඩර් අයදුම්පතට අමුණා එවිය යුතුය.

5. දුරකථන අංක : 0773089722 සහ 038-2232438 මගින් මහජන බැංකුවේ කළුතර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය කළමනාකරු අමතා දිනයක් හා වේලාවක් වෙන්කරවාගෙන දේපළ පරීක්ෂා කිරීම හා හිමිකම් පරීක්ෂා කිරීම සිදු කළ හැකිය.

6. පානදුර, ගාළු පාර, අංක 341 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුවේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ දී කළුතර ප්‍රාදේශීය කළමනාකරු විසින් පත් කරන ලද ටෙන්ඩර් ඇගයීම් කමිටුවක් ඉදිරියේ 2026.07.20 දින පස්වරු 4.00 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරනු ලබන අවස්ථාවට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අවසරලත් නියෝජිතයකුට සහභාගී වීමට අවසර ලැබේ.

සහකාර ප්‍රාදේශීය කළමනාකරු (අයකිරීම්),
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
මහජන බැංකුව.

අංක 341, ගාළු පාර,
පානදුර.
දුරකථන අංක : 038 - 2232438, 038-2241596, 038-2235401
විද්‍යුත් තැපෑල : kalrho@peoplesbank.lk, chinthakaf@peoplesbank.lk

07 - 50

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මූතූර්**

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2026.07.25

01. මූතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2026.07.25 දින පෙ.ව. 9.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට විනාඩි 30 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය පරදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිවේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා ලද භාණ්ඩ ඒ අවස්ථාවේ දී මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් සිදුකල යුතුය.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

යූ. එල්. වසීම් අහමඩ්,
දිසා විනිසුරු/ මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මූතූර්.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *නඩු භාණ්ඩ සම්බන්ධ විස්තර* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | MC/55449/23 | අත් ට්‍රැක්ටර් (කුබෝටා) | 01 |
| 02 | MC/56040/24 | යතුරු පැදිය (TVS Victor) | 01 |
| 03 | MC/41005/19 | යතුරු පැදිය (Bajaj CT100) | 01 |
| 04 | MC/47387/20 | යතුරු පැදිය (Bajaj Platina) | 01 |
| 05 | MC/02105/26 | වැලි | කියුබ් 1.5 |
| 06 | MC/02107/26 | වැලි | කියුබ් 1.5 |
| 07 | MC/02106/26 | වැලි | කියුබ් 1.5 |
| 08 | MC/02021/26 | වැලි | කියුබ් 1.5 |
| 09 | MC/01827/26 | වැලි | කියුබ් 02 |
| 10 | MC/01825/26 | වැලි | කියුබ් 02 |
| 11 | MC/01826/26 | වැලි | කියුබ් 02 |
| 12 | MC/01713/26 | වැලි | කියුබ් 03 |
| 13 | MC/63728/26 | වැලි | කියුබ් 03 |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ සම්බන්ධ විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|
| 14 | MC/01783/26 | වැලි | 0.75 කියුබ් |
| 15 | MC/01785/26 | වැලි | 0.75 කියුබ් |
| 16 | MC/01503/26 | වැලි | 0.75 කියුබ් |
| 17 | MC/01714/26 | වැලි | 0.75 කියුබ් |
| 18 | MC/63917/26 | වැලි | 0.75 කියුබ් |
| 19 | MC/63941/26 | වැලි | 0.75 කියුබ් |
| 20 | MC/01629/26 | වැලි | 0.75 කියුබ් |
| 21 | MC/63818/26 | වැලි | 0.75 කියුබ් |
| 22 | MC/02205/26 | වැලි | කියුබ් 03 |
| 23 | MC/02315/26 | වැලි | කියුබ් 03 |
| 24 | MC/01718/26 | වැලි | කියුබ් 0.75 |
| 25 | MC/01717/26 | පස් | 0.75 කියුබ් |
| 26 | MC/01716/26 | පස් | 0.75 කියුබ් |
| 27 | MC/01715/26 | පස් | 0.75 කියුබ් |
| 28 | නඩු අංක හඳුනා නොගත් නඩු භාණ්ඩ | පස් | කියුබ් 03 |
| 29 | MC/02033/26 | කැලේ පිහිය (කුඩා) | 01 |
| 30 | MC/01778/26 | ලොකු යකඩ බාල්දි (හිල් සහිත) | 01 |
| 31 | MC/MS/02478/26 | ලොකු යකඩ බාල්දි (හිල් සහිත) | 18 |
| 32 | MC/MS/02478/26 | පොඩි යකඩ බාල්දි (හිල් සහිත) | 16 |
| 33 | BR/753/23 | පොරොව | 01 |
| 34 | MC/62221/25 | පොරොව | 01 |
| 35 | MC/02035/26 | පොරොව | 01 |
| 36 | MC/57495/23 | පොරොව | 01 |
| 37 | MC/63806/26 | පොරොව | 01 |
| 38 | MC/01772/26 | පොරොව | 01 |
| 39 | MC/01773/26 | පොරොව | 01 |
| 40 | MC/02183/26 | පොරොව | 01 |
| 41 | MC/02105/26 | සවල් | 01 |
| 42 | MC/02106/26 | සවල් | 01 |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ සම්බන්ධ විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|
| 43 | MC/02107/26 | සවල් | 01 |
| 44 | MC/63930/26 | සවල් | 01 |
| 45 | MC/01629/26 | සවල් | 01 |
| 46 | MC/01714/26 | සවල් | 01 |
| 47 | MC/63953/26 | සවල් | 01 |
| 48 | MC/01785/26 | සවල් | 01 |
| 49 | MC/63522/26 | සවල් | 01 |
| 50 | MC/63932/26 | සවල් | 01 |
| 51 | MC/01783/26 | සවල් | 01 |
| 52 | MC/01971/26 | සවල් | 01 |
| 53 | MC/01784/26 | සවල් | 01 |
| 54 | MC/MS/02478/26 | සවල් | 01 |
| 55 | MC/63476/26 | ලොකු මිටිය | 01 |
| 56 | MC/63656/26 | ඇලුමිනියම් මුට්ටිය | 01 |
| 57 | MC/63659/26 | ඇලුමිනියම් මුට්ටිය | 01 |
| 58 | MC/63654/26 | ඇලුමිනියම් තාච්චිය | 01 |
| 59 | MC/02395/26 | ඇලුමිනියම් මුට්ටිය | 01 |
| 60 | MC/02517/26 | ඇලුමිනියම් මුට්ටිය | 1 |
| 61 | MC/02395/26 | කුඩා ඇලුමිනියම් මුට්ටිය (හිල් සහිත) | 01 |
| 62 | MC/02517/26 | කුඩා ඇලුමිනියම් මුට්ටිය (හිල් සහිත) | 01 |
| 63 | MC/63541/26 | ඇලුමිනියම් තාච්චිය | 01 |
| 64 | MC/63641/26 | කිඩාරම | 01 |
| 65 | MC/63572/26 | කුඩා නියන | 01 |
| 66 | MC/63572/26 | මට්ටම් කටුව | 01 |
| 67 | MC/63572/26 | මැනුම් පටිය | 01 |
| 68 | MC/63572/26 | කියත | 01 |
| 69 | නඩු අංකය හඳුනා නොගත් නඩු භාණ්ඩ | ස්කාෆ්ෆොල්ඩින් ජොයින්ට් | පොඩ්ඩක් |
| 70 | නඩු අංකය හඳුනා නොගත් නඩු භාණ්ඩ | භාවිතා කරන ලද වයර් | පොඩ්ඩක් |
| 71 | MC/01719/26 | ඉලෙක්ට්‍රොනික තරාදි | 01 |
| 72 | නඩු අංකය හඳුනා නොගත් නඩු භාණ්ඩ | ඩීවීඩී ප්ලේයර් | 01 |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ සම්බන්ධ විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|
| 73 | නඩු අංකය හඳුනා නොගත් නඩු භාණ්ඩ | ඩීවීඩී ප්ලේයර් | 02 |
| 74 | නඩු අංකය හඳුනා නොගත් නඩු භාණ්ඩ | ඩීවීඩී ප්ලේයර් | 01 |
| 75 | නඩු අංකය හඳුනා නොගත් නඩු භාණ්ඩ | ඩීවීඩී ප්ලේයර් | 01 |
| 76 | නඩු අංකය හඳුනා නොගත් නඩු භාණ්ඩ | තරාදිය | 01 |
| 77 | MC/63729/26 | යකඩ බැරල් | 04 |
| 78 | MC/63764/26 | යකඩ බැරල් | 05 |
| 79 | MC/02431/26 | යකඩ බැරල් | 02 |
| 80 | MC/02395/26 | ප්ලාස්ටික් බැරල් | 01 |
| 81 | නඩු අංකය හඳුනා නොගත් නඩු භාණ්ඩ | පොඩි හිස් කෑන් | - |
| 82 | නඩු අංකය හඳුනා නොගත් නඩු භාණ්ඩ | ලොකු හිස් කෑන් | - |
| 83 | නඩු අංකය හඳුනා නොගත් නඩු භාණ්ඩ | වීදුරු හිස් බෝතල් | - |
| 84 | නඩු අංකය හඳුනා නොගත් නඩු භාණ්ඩ | බියර් හිස් බෝතල් | - |
| 85 | MC/02478/26 | වැලි සඳහා භාවිතා කරන ලද බට | 08 |
| 86 | MC/02478/26 | වැලි සඳහා භාවිතා කරන ලද L බාර් | 03 |
| 87 | MC/60247/25 | CCTV කැමරා සහ ඇඩප්ටර් | 01 |

07 - 47

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - හිඟුරක්ගොඩ**

අධිකරණයට ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන කල්තබා ගත නොහැකි නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. හිඟුරක්ගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන, කල්තබා ගත නොහැකි භාණ්ඩ **2026.07.25** වන දින **පෙ.ව. 9.30** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම්, වෙන්දේසිය පවත්වනු ලබන දින, වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්තුමාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1 1/2 කට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර දැමීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේ දී හා මුදල් ගෙවීමේදී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, භාණ්ඩ මිල දී ගැනීමට එන සෑම අයෙකුටම ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

06. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. භාණ්ඩ මිලදී ගැනීම මුදලින් කළ යුතු අතර, මිල දී ගන්නා ලද භාණ්ඩ වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ දී ප.ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

ඩී. පී. එස්. එම්. කරුණාරත්න,
දිසා විනිසුරු/ මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - හිඟුරක්ගොඩ.

2026 ජුනි මස 25 දින,
හිඟුරක්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ වර්ගය | අයිතම ගණන |
|---|---|---|---|
| 01 | 43626 | CP JO 3510 ත්‍රිරෝද රථය | 01 |
| 02 | PMB/30/25 | WP GE 8172 යතුරු පැදිය | 01 |
| 03 | PMB/17/25 | අංක රහිත යතුරු පැදිය | 01 |
| 04 | 79558 | BGX 2667 යතුරු පැදිය | 01 |
| 05 | 88865 | BFY 9935 යතුරු පැදිය | 01 |
| 06 | AR 1449/21 | HD 4644 යතුරු පැදිය | 01 |
| 07 | 69576 | HS 2497 යතුරු පැදිය | 01 |
| 08 | 80514 | 48 CC යතුරු පැදිය | 01 |
| 09 | 16638 | MH 2140 යතුරු පැදිය | 01 |
| 10 | 92575 | TJ 2646 යතුරු පැදිය | 01 |
| 11 | PT/01/25 | 49-3823 දරන ට්‍රැක්ටර් රථය | 01 |
| 12 | PT/07/25 | අත් ට්‍රැක්ටර් ට්‍රේලරය | 01 |
| 13 | PT/08/25 | අත් ට්‍රැක්ටර් ට්‍රේලරය | 01 |
| 14 | 16511 | හිසෙහි පළඳින විදුලි පන්දම | 01 |
| 15 | 17002 | ප්ලාස්ටික් බාල්දි | 01 |
| 16 | 10990 | ජංගම දුරකථන | 01 |

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ වර්ගය* | *අයිතම ගණන* |
|---|---|---|---|
| 17 | 551/24 | යකඩ බාල්දි | 02 |
| | | උදලු | 02 |
| | | ගැරුම් වට්ටි | 02 |
| | | අලවංගු | 02 |
| | | ප්ලාස්ටික් තාච්චි | 02 |
| 18 | 16510 | නිල් පැහැති ඔරු | 01 |
| | | විදුලි පන්දම් | 01 |
| 19 | 16512 | නිල්, සුදු හා කොළ පැහැති ඔරු | 01 |
| | | විදුලි පන්දම් | 01 |
| 20 | 10264 | පොඩි ගෑස් ලිප් | 01 |
| 21 | 15547 | පොඩි ගෑස් ලිප් | 01 |
| 22 | 15344 | පිහි | 01 |
| | | පොරව | 01 |
| | | විදුලි පන්දම් | 04 |
| | | ප්ලාස්ටික් කිරි කෑන් | 01 |
| | | ටෙන්ට් ඉටි රෙදි | 01 |
| | | බූට් සපත්තු ජෝඩු | 01 |
| 23 | 93998 | ජංගම දුරකථන | 01 |
| 24 | 16699 | අලවංගු | 01 |
| | | යකඩ කූරු | 01 |
| | | ගල් කටු | 02 |
| | | ප්ලාස්ටික් බට | 02 |
| 25 | 4724/26 | උදලු | 01 |
| | | ගැරුම් වට්ටි | 01 |
| | | ප්ලාස්ටික් තාච්චි | 01 |
| 26 | 14853 | ලී මිට සහිත පිහි | 01 |
| 27 | 5086 | උදලු | 01 |
| | | කැට කුඩ | 01 |
| 28 | 17863 | විදුලි පන්දම් | 01 |
| 29 | 16595 | ප්ලාස්ටික් වතුර ටැංකි | 01 |
| 30 | 17171/26 | විදුලි පන්දම් | 02 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ වර්ගය | අයිතම ගණන |
|---|---|---|---|
| 31 | 5150 | ලී මිට සහිත පිහි | 01 |
| 32 | 18260/26/B | ලීටර් 500 ප්ලාස්ටික් වතුර බූලි | 01 |
| | | නිල් පාට බැරල් | 02 |
| 33 | 18338 | ඔරු | 01 |
| 34 | 18258 | කැති | 01 |
| 35 | 18211 | සී. අයි. සී. යූරියා පොහොර 50kg අසුරන | 01 |
| 36 | 18190 | 12.5kg නිල් පැහැති ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 37 | අංක රහිත | යකඩ බැරල් තොගයක් | |
| 38 | අංක රහිත | බූලි තොගය | |
| 39 | අංක රහිත | වීදුරු බෝතල් තොගය | |

07 - 71

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මන්නාරම**

මන්නාරම අධිකරණය මගින් රාජසන්තක කරන ලද මෙතෙක් අයිතිවාසිකම් පවරණු නොලැබූ භාණ්ඩ
ප්‍රසිද්ධියේ වෙන්දේසි කිරීම

01. මන්නාරම අධිකරණය මගින් රාජසන්ක කරන ලද මෙතෙක් අයිතිවාසිකම් පවරණු නොලැබූ භාණ්ඩ 2026.07.19 වන දින උදෑසන 10.00 ට අඩම්පන් පොලිස් ස්ථානයේ දී වෙන්දේසි කරනු ලැබේ.

02. මෙහි සඳහන් ඕනෑම භාණ්ඩයක් සඳහා හිමිකම් කියන අයෙකු විකිණීම ආරම්භ වීමට පැය භාගයකට පෙර තම හිමිකම් පෑම ඉදිරිපත් කළ යුතුය.

03. මෙහි ඇති භාණ්ඩ වෙන්දේසියට පැය භාගෙකට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ඇතිව පරීක්ෂා කර බැලීමට හැකිය.

04. වෙන්දේසියට තබා ඇති ඕනෑම භාණ්ඩයක අපේක්ෂිත වටිනාකම නොමැති නම් විකිණීම ඉල්ලාඅස්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුය.

05. විකුණන ලද භාණ්ඩ සඳහා වහාම මුදල් ගෙවා පොලිස් ස්ථානයේ භූමියෙන් භාණ්ඩ ඉවත් කරගත යුතුය. ගෙවීම් මුදලින්ම සිදු කළ යුතුය. චෙක්පත් පිළිගනු නොලැබේ.

06. මෙම භාණ්ඩ මිල දී ගනු ලබන තැනැත්තන් නොවරදවාම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

අයි. එන්. රිස්වාන්,
දිසා විනිසුරු / මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - මන්නාරම.

2026 ජූනි මස 16 දින,
මන්නාරම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

අඩම්පන් පොලිස් ස්ථානයේ වෙන්දේසියට ඇති වැලි පිළිබඳ විස්තරය

| *අනු. අංකය* | *නඩු අංකය* | *පී. ආර්. අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | AR/1018/25 | PR/530/25 | ගංගා වැලි | කියුබ් 15 1/2 |
| 02 | AR/1254/25 | PR/539/25 | ගංගා වැලි | කියුබ් 2 1/2 |
| 03 | AR/1254/25 | PR/540/25 | | |
| 04 | AR/1254/25 | PR/732/25 | | |
| 05 | AR/1254/25 | PR/738/25 | | |
| 06 | AR/1254/25 | PR/743/25 | | |

07 - 54

---

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය අනුගාමීව, 2026 මාර්තු 02 දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් සමාගමේ නාමය (8 වගන්තියට අනුකූලව) වෙනස්කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නාමය : මනීෂා එන් කාබන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 75745
ලියාපදිංචි කාර්යාල ලිපිනය : මුල්කිරිගල පාර, ඕකේවෙල වීරකැටිය
සමාගමේ නම : ජැකොබ් කාබන්ස් මනීෂා (ප්‍රයිවට්) ලිමිටඩ්

ඉහත සමාගම වෙනුවෙන්,

බිස්නස් ඉන්ටෙලිජන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 10, ගෝතමී පාර,
කොළඹ 08.

07 - 21

**2007 අංක 07 දරන සමාගම් පනතෙහි 9(2) වගන්තිය යටතේ**

ලියාපදිංචි අංක PV 00226150 දරන "AIRCRAFT RECYCLING (PRIVATE) LIMITED" සමාගම් නාමය 2026.06.04 වන දින සිට ක්‍රියාත්මක වූ පරිදි "SPENCE VISA SERVICES (PRIVATE) LIMITED" ලෙස වෙනස් කෙරෙන බව මෙයින් දන්වා සිටී.

සමාගමේ ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 315, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒයිට්කන් ස්පෙන්ස් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

07 - 32

---

**සමාගම් පනත අංක 07 දරන 2007 හි 59(2) වගන්තිය යටතේ මහජන නිවේදනය**

සමාගම් පනත අංක 07 දරන 2007 හි 59 (2) වගන්තියේ විධිවිධාන අනුව, Reitzel Walker (Pvt) Ltd (PV 96336) සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය (Stated Capital) රුපියල් පන්සිය අනූ හය මිලියන එක්ලක්ෂ හයසිය පනස් දෙකක් (රු. 596,100,652/-) සිට රුපියල් මිලියන දෙසිය හැත්තෑ පහ (රු. 275,000,000/-) දක්වා අඩු කිරීමට යෝජනා කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම ප්‍රාග්ධන අඩු කිරීම සිදු කරනු ලබන්නේ සමාගමේ රඳවාගත් අලාභ (Retained Losses) ප්‍රකාශිත ප්‍රාග්ධනයට එරෙහිව ගැලපීම Set - off) මගින් වන අතර, එමගින් සමාගමේ නිකුත් කර සම්පූර්ණයෙන් ගෙවා ඇති කොටස් සංඛ්‍යාවෙහි කිසිදු වෙනසක් සිදු නොවේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

Reitzel Walker (Pvt) Ltd,
සමාගම් ලේකම්වරු.

07 - 38

---

**සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ මහජන දැනුම්දීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 08 වන වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව 2026 ජුනි 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් සමාගමේ නම වෙනස් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| සමාගමේ පෙර නාමය | : | රීගල් ග්‍රවුන්ඩ් ට්‍රාන්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය | : | PV 99242 |
| සමාගමේ ලියාපදිංචි කාර්යාල ලිපිනය | : | අංක 142, 2/2 ගාලු පාර, කොළඹ 03 |
| සමාගමේ නව නම | : | ඊජීටී ග්ලෝබල් (පීවීටී) එල්ටීඩී |

මාණ්ඩලික නියෝග මත,

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ආයතනික ලේකම්.

07 - 48

**ට්‍රාන්ස්කෝ කාර්ගෝ ලිමිටඩ් - PB 00234232**

සමාගමේ තත්ත්වය වෙනස් කිරීම හේතුවෙන් නාමය වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 11(5) වගන්තිය අනුව දැනුම්දීම

මෙයින් දැනුම් දෙනු ලබන්නේ TRANSCO CARGO LIMITED - PB 00234232 සමාගම විසින් 2026 ජූලි 02 වන දින විශේෂ යෝජනාවක් (Special Resolution) සම්මත කරමින් සමාගමේ තත්ත්වය පොදු සමාගමකින් (Public Company) පෞද්ගලික සමාගමක් (Private Company) බවට වෙනස් කිරීමට තීරණය කළ බවයි.

ඒ අනුව, 2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වන වගන්තියේ (1) උපවගන්තියේ විධිවිධාන අනුව, සමාගමේ නාමයේ ඇති "Limited" යන වචනය වෙනුවට "(PVT) LTD" යන්න යොදා සමාගමේ නාමය TRANSCO CARGO (PVT) LTD ලෙස වෙනස් කිරීමට සමාගම තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

මණ්ඩලයේ නියෝගය පරිදි,

ට්‍රාන්ස්කෝ කාර්ගෝ ලිමිටඩ් සමාගම,
ෆ්‍රොන්ටියර් සෙක්‍රේටේරියල් හවුස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරුන්.

07 - 82

---

**ප්‍රසිද්ධ දැන්වීමයි**

ලොටස් ෆෝහන්ඩ්‍රඩ් ඇන්ඩ් ෆිෆ්ටිසික්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 94800) සහ ස්ට්‍රැටෙජික් ටැක්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 00240304) යන සමාගම් ඒකාබද්ධ වීමේ නිවේදනයයි.

ලොටස් ෆෝහන්ඩ්‍රඩ් ඇන්ඩ් ෆිෆ්ටිසික්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ස්ට්‍රැටෙජික් ටැක්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයන් මත අදාළ සමාගම් දෙක, 2007 අංක 07 දරන සමාගම් පනතේ 242(1) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කොට, තවදුරටත් ලොටස් ෆෝහන්ඩ්‍රඩ් ඇන්ඩ් ෆිෆ්ටිසික්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ තනි සමාගමක් වශයෙන් පවත්වාගෙන යාමට තීරණය කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීම සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් අනුමත කරන දිනයක සිට ක්‍රියාත්මක වීමට නියමිතයි.

අධ්‍යක්ෂවරු,

ලොටස් ෆෝහන්ඩ්‍රඩ් ඇන්ඩ් ෆිෆ්ටිසික්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 94800),
සහ ස්ට්‍රැටෙජික් ටැක්ස්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 00240304).

07 - 60

---

**ප්‍රසිද්ධ දැන්වීමයි**

සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 65282) සහ එස් එච් කෝපරේට් ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 65991) යන සමාගම් ඒකාබද්ධ වීමේ නිවේදනයයි.

සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ එස් එච් කෝපරේට් ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයන් මත අදාළ සමාගම් දෙක, 2007 අංක 07 දරන සමාගම් පනතේ 242(1) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කොට,

තවදුරටත් සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ තනි සමාගමක් වශයෙන් පවත්වාගෙන යාමට තීරණය කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීම සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් අනුමත කරන දිනයක සිට ක්‍රියාත්මක වීමට නියමිතයි.

අධ්‍යක්ෂවරු,

සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 65282),
සහ එස් එච් කෝපරේට් ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 65991).

07 - 59

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 59(2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ ප්‍රාග්ධනය අවකරණය පිළිබඳ මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| සමාගමේ නාමය | : | පයින්හර්ස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි අංකය | : | PV 69112 |
| ලියාපදිංචි ලිපිනය | : | අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05. |
| අවකරණයට පෙර ප්‍රාග්ධනය | : | රු. 347,718,225 |
| අවකරණයට පසු ප්‍රාග්ධනය | : | රු. 90,480,765 |
| අවකරණය කරන මුදල | : | රු. 257,237,460 |

සෙක්‍රටේරියල් හවුස් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 10, හැව්ලොක් පෙදෙස,
කොළඹ 05.

07 - 58

---

## ෆිනික්ස් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
## (පීබී 807පීවී)

2007 අංක 07 දරන සමාගම් පනතේ 244(3) වගන්තිය ප්‍රකාරව ග්‍රැෆියෝ වූ (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගමේ ලියාපදිංචි අංකය පීවී 116605) ෆිනික්ස් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගමේ ලියාපදිංචි අංකය පීබී 807පීවී) සමග එම පනතේ 242(1) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2026 පෙබරවාරි මස 27 වන දින *ගැසට්* පත්‍රය හා දිණමිණ, ඩේලි නිව්ස් හා තිනකරන් පුවත්පත් හරහා අප විසින් නිවේදනය කරන ලද ග්‍රැෆියෝ වූ (ප්‍රයිවට්) ලිමිටඩ්, ෆිනික්ස් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමග යෝජිත ඒකාබද්ධ වීම පිළිබඳ නිවේදනය ප්‍රකාරව එකී සමාගම් දෙකෙහි ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වී ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ. ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේ දී නිකුත් කරන ලද ඒකාබද්ධ කිරීමේ සහතික පත්‍රයේ සඳහන් දිනය වන 2026 මාර්තු 31 වන දින, ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේ කාර්යසාධනය දිනය වේ.

ෆිනික්ස් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා සහ වෙනුවෙන්
පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2026 මැයි මස 07 වැනි දින.

07 - 57

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**
**මන්නාරම ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර

**උපලේඛනය**

උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්තයි බටහිර කොට්ඨාසය, මන්තයි බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මන්තයි බටහිර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පලයිපෙරුමල්කඩ්ඩු හි අංක MN/33, ග්‍රාම සේවක කොට්ඨාසයේ මන්තයි උතුර පලයිපෙරුමල්කඩ්ඩු ගමේ පිහිටි බෙදා වෙන් කරන ලද රාජ්‍ය ඉඩම් කොටස,

ප්‍රමාණය අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් බිංදුවයි නවය (අ.02, රූ.02, පර්.09) ක විශාලත්වයෙන් වූ ඉඩම වේ.

ඉහත කී මන්තයි බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මන්තයි බටහිර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පලයිපෙරුමල්කඩ්ඩු හි අංක MN/33, ග්‍රාම සේවක කොට්ඨාසයේ මන්තයි උතුර පලයිපෙරුමල්කඩ්ඩු ගමේ පිහිටි ඉඩමට ත්‍රිකුණාමලයේ බලයලත් මිනින්දෝරු සහ මට්ටම්කරු කේ. අරුමුගම් විසින් 2017 ජූනි මස 21 වන දින ඇඳ පිළියෙල කරන ලද අංක 3021 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස.

හෙක්ටයාර් බිංදුවයි දශම හයයි හතයි හයයි අට (0.6768) ක ඊට සමාන අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් විසි හතයි දශම හය (අ. 1, රූ.2, පර්. 27.6) ක විශාල ඉඩම සමග නිවස සහ එහි පිහිටි අනෙකුත් ගොඩනැගිලි වේ.

පලයිපෙරුමල්කඩ්ඩු, වඩ්ඩකන්ඩල් හි මයිල්වාගනම් කනගලිංගම් ණයකරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට ඉහත උපලේඛනයේ සඳහන් දේපළ උකස් කර ඇත.

උපලේඛනය - රාජ්‍ය ඉඩම (අ.02, රූ.02, පර්.09) සහ ලොට් 1 (අ.01, රූ.02, පර්.27.6)

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 31 දින පෙ.ව. 10.30 ට,**

ඉහත ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

***යෝජනා සම්මුතිය සඳහා :-***
2026.04.10 දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2026.04.23 දින දිවයින, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න.

***දේපළ වෙත පිවිසීම :-***
උපලේඛනය - රාජ්‍ය ඉඩම් කොටස (අ.02, රූ.02, පර්.09) සහ ලොට් 1 (අ.01, රූ.01, පර්.27.6)
වඩ්ඩකන්ඩල් හංදියේ සිට වාරිමාර්ග වෙන්කිරීම් පාර ඔස්සේ මෙහි සිට මීටර් 650ක දුරක් ගමන් කළ විට දේපළ පාරේ වම් පැත්තේ පිහිටා ඇත.

***ගෙවීමේ ක්‍රමය :-***
විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (1%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ;
4. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 2,000/-;
5. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
6. ගැනුම්කරු විසින් එකතු කළ අගය මත වට්නාකම් බද්ද (VAT) ගෙවිය යුතුය;
7. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ මන්නාරම ශාඛාවේ තැන්පත් කළ යුතුය.

***හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-***
කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.,
අංක 45,
වල්වුතයම් කම්ප්ලෙක්ස්,
කෙළින් වීදිය,
මන්නාරම.
දුරකථන අංක : 023 2251500.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු.

අංක 7/1/10,
1 වන මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංක : 011 2396520/ 077 3242954.

07-77

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**
**නුවරඑළිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) මගින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාර

**පළමු වන උපලේඛනය**

01. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔය පළාත

කෝරළේ, නුවරඑළිය මහ නගර සභා සීමා සහ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත නුවරඑළිය මධ්‍යම - 535 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ලෝසන් වීදියේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු, එස්.පී. රත්නායක විසින් 2014.08.14 දින පිළියෙල කරන ලද අංක 5169/B දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 5 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණය පර්චස් එකයි දශම හතරයි එක (පර්: 1.41) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියළුදේත් සමඟ වේ.

02. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔය පළාත කෝරළේ, නුවරඑළිය මහ නගර සභා සීමා සහ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත නුවරඑළිය මධ්‍යම - 535 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ලෝසන් වීදියේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු, එස්.පී. රත්නායක විසින් 2014.08.14 දින පිළියෙල කරන ලද අංක 5169/B දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම හතයි හත (පර්: 6.77) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියළුදේත් සමඟ වේ.

03. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔය පළාත කෝරළේ, නුවරඑළිය මහ නගර සභා සීමා සහ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත නුවරඑළිය මධ්‍යම - 535 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ලෝසන් වීදියේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු, එස්.පී. රත්නායක විසින් 2014.08.14 දින පිළියෙල කරන ලද අංක 5169/B දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 3 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම හතරයි එක (පර්: 10.41) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියළුදේත් සමඟ වේ.

04. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔය පළාත කෝරළේ, නුවරඑළිය මහ නගර සභා සීමා සහ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත නුවරඑළිය මධ්‍යම - 535 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ලෝසන් වීදියේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු, එස්.පී. රත්නායක විසින් 2014.08.14 දින පිළියෙල කරන ලද අංක 5169/B දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් විසි හයයි දශම නවයයි හත (පර්: 26.97) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලුදේත් සමඟ වේ.

**දෙවන උපලේඛනය**

මධ්‍යම පළාතේ, නුවරඑළිය කොට්ඨාසයේ සහ දිස්ත්‍රික්කයේ, ඔය පළාත කෝරළේ, නුවරඑළිය මහ නගර සභා සීමා සහ නුවරඑළිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත නුවරඑළියේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු, එස්.පී. රත්නායක විසින් 2014 අගෝස්තු මස 14 දින පිළියෙල කරන ලද අංක 5169/B දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 06 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම හතරයි එක (පර්: 1.41) ක *හෙවත්* හෙක්ටයාර් 0.0036 ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලුදේත් සමඟ වේ.

පහත විස්තර කරන ලද මාර්ග අයිතිය සමග වේ.

මධ්‍යම පළාතේ, නුවරඑළිය කොට්ඨාසයේ සහ දිස්ත්‍රික්කයේ, ඔය පළාත කෝරළේ, නුවරඑළිය මහ නගර සභා සීමා සහ නුවරඑළිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත නුවරඑළියේ පිහිටි "ලෝසන් වීදියේ වරිපනම් අංක 3, 5, 7, 9 සහ 11 හි කොටස" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, ජී.එල්.බී. නානායක්කාර විසින් 1991 ඔක්තෝබර් මස 17 දින පිළියෙල කරන ලද අංක 10225 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක A5 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම නවයයි බිංදුව (පර්: 3.90) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලුදේත් සමඟ වේ.

පළමුවන උපලේඛනය

මෙහි ලොට් අංක 5, 2, 3, 1 (අ.0, රූ.0, පර්.45.56)

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 28 දින පෙ.ව. 10.00 ට ද,**

දෙවන උපලේඛනය

ලොට් අංක 06 (අ.0, රූ.0, පර්.1.41)

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 28 දින පෙ.ව. 10.30 ට ද,**

ඉහත ස්ථාන වල දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

***යෝජනා සම්මුතිය සඳහා :-***
2025.08.07 සහ 2026.02.20 දිනයන්හි රජයේ *ගැසට් පත්‍ර* ද, 2025.08.11 සහ 2026.02.20 දිනයන්හි දිවයින, දි අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් බලන්න.

***දේපළ වෙත පිවිසීම :-***
පළමුවන හා දෙවන උපලේඛනය
නුවරඑළිය බසාර් වීදිය සිට ලෝසන් වීදිය ඔස්සේ මීටර් 50ක් පමණ ගමන් කළ විට විෂයගත දේපළ වෙත ළඟාවිය හැක.

***ගෙවීමේ ක්‍රමය :-***
විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (1%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ;

4. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 2,000/-;
5. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
6. ගැනුම්කරු විසින් එකතු කළ අගය මත වට්නාකම් බද්ද (VAT) ගෙවිය යුතුය;
7. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ නුවරඑළියේ ශාඛාවේ තැන්පත් කළ යුතුය.

***හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-***

කළමනාකරු - ණය අයකර ගැනීම්,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.,
අංක 36/3,
බුද්ධ ජයන්ති මාවත,
නුවරඑළිය.
දුරකථන අංක : 052 2223761.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු.

අංක 7/1/10,
1 වන මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංක : 011 2396520/ 077 3242954.

07-76

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**
**බම්බලපිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 682 A - කුරුප්පුමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පානදුර කුරුප්පුමුල්ල හි පිහිටි "කහටගහවත්ත, පරංගියාවත්ත සහ කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්. එස්. සී. විතාන විසින් 2019.06.16 වැනි දින පිළියෙල කරන ලද අංක 7356 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A (බලයලත් මිනින්දෝරු එල්. ඩබ්. එල්. ද සිල්වා විසින් 1995.10.10 වැනි දින පිළියෙල කරන ලද අංක 12544 දරන පිඹුරේ දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් පහළොව (අ.0, රූ.0, පර්. 15)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

පානදුර, කුරුප්පුමුල්ල, අංක 189/13 දරන ස්ථානයේ විදානලාගේ සංජීව ද මැල් ණයකරු ලෙස, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 30 දින පෙ.ව. 10.00 ට,**

ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

***යෝජනා සම්මුතිය සඳහා :***
2026.05.15 දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2026.05.18 දින දිවයින, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න.

***දේපළ වෙත පිවිසීම :***
පානදුර නගරයේ සිට කොළඹ පාර ඔස්සේ ගමන් කර, පානදුර පොලිස් ස්ථානය ළඟින් දකුණු අත පැත්තට හැරෙන පාරේ මීටර් 800ක් පමණ ගමන් කළ විට Y හන්දියක් හමුවේ. එතැනින් දකුණු අත පැත්තට හැරී කිලෝමීටරයක් පමණ ගමන් කළ විට සුහද පෙදෙස - 2 හමුවන අතර, එතැනින් වම් අත පැත්තට හැරී මීටර් 50ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ දකුණු අත පැත්තේ වරිපනම් අංක 189/13 වේ.

***ගෙවීමේ ක්‍රමය :***
විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (1%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ;
4. නොතාරිස් ගාස්තුව;
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 2,000/-;
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැනුම්කරු විසින් එකතු කළ අගය මත වට්නාකම් බද්ද (VAT) ගෙවිය යුතුය;
8. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ බම්බලපිටිය ශාඛාවේ තැන්පත් කළ යුතුය.

*නිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :*

ජ්‍යෝෂ්ඨ කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.,
අංක 232, ගාලු පාර,
කොළඹ 04.
දුරකථන අංක : 0112507724
ෆැක්ස් : 011 2591440.

ඒ. එස්. කුමාරි,
සාමවිනිසුරු, තක්සේරුකරු,
වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්.

අංක 109/21,
පෙලෙන්ගස්තුඩුව පාර,
බොරැල්ල.
දුරකථන අංක : 0763619284/0710743193.
ඊමේල් : susilakumari339@gmail.com

07-61

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**
**ඇඹිලිපිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර

**උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය නාගරික සභා සීමා තුළ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 214, උඩගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත උඩගම ගමේ පිහිටි "ජාසින්, ජාලන්, ජාගොඩ පංගුවේ කොටස" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. ධර්මරත්න විසින් 2012.10.28 දින පිළියෙල කරන ලද අංක 2484 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 04 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි පහයි දශම හය (රූ.1, පර්. 25.6) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඇඹිලිපිටිය, උඩගම, චන්දන නිවස අංක 554 දරන ස්ථානයේ "චන්දන ට්‍රේඩර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන ඇඹිලිපිටිය, උඩගම, පනාමුර පාරේ, අංක 1698 දරන ස්ථානයේ මිතලාවේ අලුත්ගමගේ දිල්හාරා සංජීවනී වික්‍රමරත්න ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 24 දින පෙ.ව. 10.00 ට,**

ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

***යෝජනා සම්මුතිය සඳහා :***
2025.11.28 දින රජයේ *ගැසට් පත්‍රය* ද, දිවයින, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න.

***දේපළ වෙත පිවිසීම :***
ඇඹිලිපිටිය නගරයේ ඔරලෝසු කණුව සිට රත්නපුර පාර කිලෝමීටර් 1.2ක් පමණ ගමන් කළ විට උඩගම හංදිය හමුවන අතර, එතැනින් වමට හැරී පනාමුර පාරේ මීටර් 800ක් පමණ ගමන් කළ විට ආර්. ඩී. හාඩ්වෙයාර් සැන්ඩ් ස්ටෝ හමුවන අතර, අදාළ දේපළ සැන්ඩ් ස්ටෝ විරුද්ධ පැත්තේ පනාමුර පාරේ වම්පැත්තේ පිහිටා ඇත.

***ගෙවීමේ ක්‍රමය :***
විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (1%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ;
4. නොතාරිස් ගාස්තුව;
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 2,000/-;
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැනුම්කරු විසින් එකතු කළ අගය මත වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුය;
8. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ බම්බලපිටිය ශාඛාවේ තැන්පත් කළ යුතුය.

*නිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :*

ජ්‍යෝෂ්ඨ කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.,
අංක 67,නෝනගම පාර,
පල්ලේගම,
ඇඹිලිපිටිය.
දුරකථන අංක : 047 2230258-9
ෆැක්ස් : 0472261590.

ඒ. එස්. කුමාරි,
සාමවිනිසුරු, තක්සේරුකරු,
වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්.

අංක 109/21,
පෙලෙන්ගස්තුඩුව පාර,
බොරැල්ල.
දුරකථන අංක : 0763619284/0710743193
ඊමේල් : susilakumari339@gmail.com

07-63

---

**ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් ලියා සහතික කරන ලද 2024.07.19 දිනැති අංක 28145, 28143 දරන උකස් බැඳුම්කරයන් සහ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තෑව විසින් ලියා සහතික කරන ලද 2024.11.21 දිනැති අංක 15639 දරන උකස් බැඳුම්කරය යන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, සිය ලියාපදිංචි කාර්යාලය තුත්තිරිපිටිගම පවත්වාගෙන යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන PV 00215898 දරන ස්ට්‍රෝංෆ්ෆීඩ් (ප්‍රයිවෙට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින් ද,

**1 වන වෙන්දේසිය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ, අලුත්කුරු කෝරළේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටාන ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත අංක 155/B ආඬිඅම්බලම නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ආඬිඅම්බලම ගමේ පිහිටි "කැටකැලගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. කේ. අබේකෝන් විසින් සාදන ලද 2023.12.23 දිනැති අංක 2892 දරන පිඹුරේ දැක්වෙන ලොට් 01 වශයෙන් ලකුණු කොට බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට එකී පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් තිස් පහයි දශම හයයි දෙකක් (අ.0, රූ.1, පර්. 35.62) විශාල ඉඩම, එහි පිහිටි පස, ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ ඊට සම්බන්ධ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මිනින්දෝරු කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් සාදන ලද 2022.10.18 දිනැති අංක 8495 දරන පිඹුරේ ලොට් 2 මතින් හා ඔස්සේ වන මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත සඳහන් දේපළ,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 23 දින පෙ.ව. 9.00 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ආරම්භ කරනු ලැබේ.

***දේපළට පිවිසීම* :** මීනුවන්ගොඩ නගර මධ්‍යයේ සිට කටුනායක පාර ඔස්සේ කි.මී. 2.6ක පමණ දුරක් ගොස් ආඬිඅම්බලම නගරය දක්වා පැමිණි විට අදාළ දේපළ මාර්ගයේ වම් පසින් පිහිටා ඇත.

**2 වන වෙන්දේසිය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ, අලුත්කුරු කෝරළේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටාන ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත අංක 155/B ආඬිඅම්බලම නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ආඬිඅම්බලම ගමේ පිහිටි "කැටකැලගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. කේ. අබේකෝන් විසින් සාදන ලද 2023.12.23 දිනැති අංක 2892 දරන පිඹුරේ දැක්වෙන ලොට් 02 වශයෙන් ලකුණු කොට බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස, එකී පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ.0, රූ.1, පර්.0) විශාල ඉඩම, එහි පිහිටි පස, ගහකොළ, වැවිලි සහ ඊට සම්බන්ධ අනෙකුත් සියලුම දේ ද සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත. බලයලත් මිනින්දෝරු කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් සාදන ලද 2022.10.18 දිනැති අංක 8495 දරන පිඹුරේ ලොට් 2 මතින් හා ඔස්සේ වන මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත සඳහන් දේපළ,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 23 දින පෙ.ව. 9.15 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ආරම්භ කරනු ලැබේ.

***දේපළට පිවිසීම* :** මීනුවන්ගොඩ නගර මධ්‍යයේ සිට කටුනායක පාර ඔස්සේ කි.මී. 2.6ක පමණ දුරක් ගොස් ආඬිඅම්බලම නගරය දක්වා පැමිණි විට අදාළ දේපළ මාර්ගයේ වම් පසින් ප්‍රධාන මාර්ගයේ සිට 2 වන ඉඩම් කොටස ලෙස පිහිටා ඇත.

**3 වන වෙන්දේසිය**

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ, අලුත්කුරු කෝරළේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටාන ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත අංක 155/B ආඬිඅම්බලම නැගෙනහිර ග්‍රාම නිලධාරි

කොට්ඨාසයේ, ආඬිඅම්බලම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. කේ. අබේකෝන් විසින් සාදන ලද 2024.08.25 දිනැති අංක 2934 දරන පිඹුරේ දැක්වෙන ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති "කැටකැලගහවත්ත" නමැති ඉඩම් කොටසට එකී පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අ.0, රූ.2, පර්. 0) විශාල ඉඩම, එහි පිහිටි පස, ගොඩනැගිලි, ගහකොළ සහ අංක 2934 දරන එකී පිඹුරේ දැක්වෙන අඩි 15ක් පළල පාර (අංක 8495 දරන පිඹුරේ ලොට් 02) අගල සහ මාර්ග අයිතිය ද පොදුවේ භාවිතා කිරීමට හා නඩත්තු කිරීමට ඇති සම්පූර්ණ නිදහස හා අයිතිය ද සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඉහත සඳහන් දේපළ,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 23 දින පෙ.ව. 9.30 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ආරම්භ කරනු ලැබේ.

***දේපළට පිවිසීම* :** මීනුවන්ගොඩ නගර මධ්‍යයේ සිට කටුනායක පාර ඔස්සේ කි.මී. 2.6ක පමණ දුරක් ගොස් ආඬිඅම්බලම නගරය දක්වා පැමිණි විට අදාළ දේපළ මීනුවන්ගොඩ - කටුනායක පාරට මුහුණලා මාර්ගයේ වම් පසින් පිහිටා ඇත.

**4 වන වෙන්දේසිය**

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ, අලුත්කුරු කෝරළේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටාන ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත අංක 155/B ආඬිඅම්බලම නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ආඬිඅම්බලම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. කේ. අබේකෝන් විසින් සාදන ලද 2024.08.25 දිනැති අංක 2934 දරන පිඹුරේ දැක්වෙන ලොට් 02 වශයෙන් ලකුණු කොට ඇති "කැටකැලගහවත්ත" නමැති ඉඩම් කොටසට එකී පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් තිස් පහක් (අ.0, රූ.0, පර්. 35) විශාල ඉඩම, එහි පිහිටි පස, ගොඩනැගිලි, ගහකොළ, සහ ඊට සම්බන්ධ අනෙකුත් සියලු දේ ද අංක 2934 දරන එකී පිඹුරේ දැක්වෙන අඩි 15 පළල පාර (අංක 8495 දරන පිඹුරේ ලොට් 02) භාවිත කිරීමට හා නඩත්තු කිරීමට ඇති අයිතිය ද අංක 2934 දරන එකී පිඹුරේ දැක්වෙන අගල ද පොදුවේ භාවිතා කිරීමට හා නඩත්තු කිරීමට ඇති සම්පූර්ණ නිදහස හා අයිතිය ද සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඉහත සඳහන් දේපළ,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 23 දින පෙ.ව. 9.45 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ආරම්භ කරනු ලැබේ.

***දේපළට පිවිසීම* :** මීනුවන්ගොඩ නගර මධ්‍යයේ සිට කටුනායක පාර ඔස්සේ කි.මී. 2.6ක පමණ දුරක් ගොස් ආඬිඅම්බලම නගරය දක්වා පැමිණි විට අදාළ දේපළට පිවිසෙන අඩි 15ක් පළල මාර්ගය වම් පසින් පිහිටා ඇති අතර එම මාර්ගය ඔස්සේ තවත් මීටර් 100ක පමණ දුරක් ගියවිට කටුනායක - මීනුවන්ගොඩ මාර්ගයේ සිට 3 වන ඉඩම් කොටස ලෙස අදාළ දේපළ පිහිටා ඇත.

**5 වන වෙන්දේසිය**

3. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ, අලුත්කුරු කෝරළේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටාන ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත අංක 155/B ආඬිඅම්බලම නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ආඬිඅම්බලම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. කේ. අබේකෝන් විසින් සාදන ලද 2024.08.25 දිනැති අංක 2934 දරන පිඹුරේ දැක්වෙන ලොට් 03 වශයෙන් ලකුණු කොට ඇති "කැටකැලගහවත්ත" නමැති ඉඩම් කොටසට එකී පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හයයි දශම අටයි නවයක් (අ.0, රූ.1, පර්. 6.89) විශාල ඉඩම, එහි පිහිටි පස, ගහකොළ සහ ඊට සම්බන්ධ අනෙකුත් සියලු දේ ද අංක 2934 දරන එකී පිඹුරේ දැක්වෙන අඩි 15 පළල පාර (අංක 8495 දරන පිඹුරේ ලොට් 02) භාවිත කිරීමට හා නඩත්තු කිරීමට ඇති අයිතිය ද අංක 2934 දරන එකී පිඹුරේ දැක්වෙන අගල ද පොදුවේ භාවිත කිරීමට හා නඩත්තු කිරීමට ඇති සම්පූර්ණ නිදහස හා අයිතිය ද සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත දැක්වෙන ඉඩම මතින් හා ඔස්සේ වන මාර්ග අයිතිය ද සමග වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ, අලුත්කුරු කෝරළේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටාන ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත අංක 155/B ආඬිඅම්බලම නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ආඬිඅම්බලම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. මෙන්ඩිස් විසින් සාදන ලද 2002 මාර්තු මස 04 සහ 02 දිනැති අංක 2530 දරන පිඹුරේ දැක්වෙන ලොට් 03 වශයෙන් ලකුණු කොට ඇති "කැටකැලගහවත්ත" නමැති ඉඩම් කොටසට එකී පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම පහක් (අ.0, රූ.0, පර්. 8.5) විශාල ඉඩම, එහි පිහිටි ඊට සම්බන්ධ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඉහත සඳහන් දේපළ,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 23 දින පෙ.ව. 10.00 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

***දේපළට පිවිසීම :-*** මීනුවන්ගොඩ නගර මධ්‍යයේ සිට කටුනායක පාර ඔස්සේ කි.මී. 2.6ක පමණ දුරක් ගොස් ආඩිඅම්බලම නගරය දක්වා පැමිණි විට අදාළ දේපළට පිවිසෙන අඩි 15 ක් පළල මාර්ගය වම් පසින් පිහිටා ඇති අතර එම මාර්ගය ඔස්සේ තවත් මීටර් 150ක පමණ දුරක් ගිය විට කටුනායක - මීනුවන්ගොඩ මාර්ගයේ සිට 3 වන ඉඩම් කොටස ලෙස වම් පසින් පිහිටා ඇත.

***යෝජනා සම්මුති දැන්වීම :-*** *රජයේ ගැසට් පත්‍රයේ* 2026.05.22 දින පළ වී ඇති අතර, දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත්වල 2026.05.14 දින පළ වී ඇත.

***ගෙවීමේ ක්‍රමය :-*** සාර්ථක ගැනුම්කරු විසින් මිටිය පහත හෙළා වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසිකරු වෙත පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) ;
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000/-;
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 2,000/- ;
6. සියලුම ප්‍රචාරක වියදම් ;

7. ගැනුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

***වැඩි විස්තර සඳහා විමසන්න :***
අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය,
ඩී.එෆ්.සී.සී. බැන්ක් පීඑල්සී,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.
දුරකථන අංක : 011 2371371.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

තුසිත් කරුණාරත්න,
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3,
විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 011-3068185, 011-2572940

07-68

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**
**(කුරුණෑගල නගර ශාඛාව)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර,

**පළමු උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, තිරගන්දහයේ කෝරළේ, කුරුණෑගල මහනගර සභා සීමාව ඇතුළත කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 834 කුරුණෑගල නගරය (ඊසාන) ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත බමුණුගෙදර ගමේ පිහිටි උතුරු වැව පාරේ, වරිපනම් අංක 22 සහ 28 සහ බමුණුගෙදර පාරේ, වරිපනම් අංක 2 සහ 10/7A දරන ස්ථානයේ පිහිටි "ලේක් සයිඩ් වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. බී. දිසානායක විසින් 2016.08.25 දින පිළියෙල කරන ලද අංක 7861 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණය රූඩ් දෙකයි පර්චස් විසි අටයි දශම දෙකක (රූ.2, පර්. 28.2) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

**දෙවන උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි පත්තුවේ, කුඩාගල්බොඩ කෝරළේ, කුරුණෑගල මහනගර සභා සීමා ඇතුළත, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ

834, කුරුණෑගල නගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත බමුණුගෙදර ගමේ පිහිටි උතුරු වැව රවුම් පාරේ වරිපනම් අංක 32 (කළින් 22) දරන ස්ථානයේ පිහිටි "ලේක්සයිඩ් එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර විසින් 2016.09.28 දින පිළියෙල කරන ලද අංක 11211 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් තිස් හතරයි දශම හතරයි අටක (පර්. 34.48) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වේ. එකී අංක 11211 දරන පිඹුරේ දැක්වෙන පොදු මාර්ග භාවිතයට ඇති අයිතිය සමග වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන කුරුණෑගල, උතුරු වැව පාරේ, අංක 28 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ /හෝ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය පිහිටා ඇති සීසන්ස් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත පළමුවන සහ දෙවන උපලේඛනයේ සඳහන් දේපළ,

පළමු උපලේඛනය - ලොට් 01 (රූ.2, පර්. 28.2)

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 22 දින පෙ.ව. 11.00 ට,**

දෙවන උපලේඛනය - ලොට් 01 (පර්. 34.48)

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 22 දින පෙ.ව. 11.15 ට,**

ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

***යෝජනා සම්මුතිය සඳහා :-*** 2025.10.10 දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2025.10.21 දින දිවයින, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න.

***දේපළ වෙත පිවිසීම :***

පළමු උපලේඛනය - ලොට් 01 (රූ.2, පර්. 28.2)

කුරුණෑගල ඔරලෝසු කණුව හංදියේ සිට දඹුල්ල පාරේ කිලෝමීටර් 1.2ක ගමන් කළ විට පොල්අත්තපිටිය හංදිය හමුවේ. එම හංදියෙන් වමට හැරී මිලේනියම් සිටි පාරේ මීටර් 40ක් පමණ ගමන් කර වමට හැරී උතුරු වැව පාරේ මීටර් 500ක් පමණ ගමන් කළ විට විෂයගත දේපළ එම පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

දෙවන උපලේඛනය - ලොට් 01 (පර්. 34.48)

කුරුණෑගල ඔරලෝසු කණුව හංදියේ සිට දඹුල්ල පාරේ කිලෝමීටර් 1.2ක ගමන් කළ විට පොල්අත්තපිටිය හංදිය හමුවේ. එම හංදියෙන් වමට හැරී මිලේනියම් සිටි පාරේ මීටර් 50ක් පමණ ගමන් කර වමට හැරී උතුරු වැව පාරේ මීටර් 525ක් පමණ ගමන් කළ විට විෂයගත දේපළ එම පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

***ගෙවීමේ ක්‍රමය :***

විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (1%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ;
4. නොතාරිස් ගාස්තුව;
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 2,000/-;
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්;
7. ගැනුම්කරු විසින් අකාලික වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුය;

8. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ කුරුණෑගල ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

*හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :*

ජ්‍යෙෂ්ඨ කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.,
අංක 140සී,
කොළඹ පාර,
කුරුණෑගල.
දුරකථන අංක : 037-2229588
ෆැක්ස් : 037-2229589

ඒ. එස්. කුමාරි,
සාමවිනිසුරු, තක්සේරුකරු,
වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්.

අංක 109/21,
පෙලෙන්ගස්තුඩුව පාර,
බොරැල්ල.
දුරකථන අංක : 076-3619284/071-0743193.
ඊමේල් : susilakumari339@gmail.com

07-65

**ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. අනුරුද්ධිකා විසින් ලියා සහතික කරන ලද 2020.11.18 දිනැති අංක 4446 සහ 4447 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් කිරීම සිය ලියාපදිංචි කාර්යාලය කඹුරුපිටියේ පවත්වාගෙන යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක පීවී 606 දරන රත්න ප්‍රොඩියුසර්ස් සිනමන් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින්,

**1 වන වෙන්දේසිය**

**අංක 4446 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

| *වෙසෙසි අංකය (ලියාපදිංචි අංකය) [Distinctive Number (Registration Number)]* | *විස්තරය, නිෂ්පාදනය, මාදිලිය, අශ්වබල යනාදිය [Description, Make, Model, Horse Power etc.]* | *චැසි අංකය [Chassis Number]* | *එන්ජින් අංකය [Engine Number]* | *තබා ඇති ස්ථානය [Place Where kept]* |
|---|---|---|---|---|
| SP CAX - 1616 | ලෑන්ඩ් රෝවර් - රේන්ජ් රෝවර් [Land Rover - Range Rover] | SALGA2LEXFA205609 | 0886770306DT | රත්න ප්‍රොඩියුසර්ස් සිනමන් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, අකුරැස්ස පාර, කඹුරුපිටිය. [Rathna Producers Cinnamon Exports (Pvt) Ltd, Akuressa Road, Kamburupitiya.] |

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් මා හට පවරන ලද බලය යටතේ මා විසින්

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 22 දින පෙ.ව. 9.30 ට**

වාහනය තබා ඇති ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

**2 වන වෙන්දේසිය**

**අංක 4447 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

| *වෙසෙසි අංකය (ලියාපදිංචි අංකය) [Distinctive Number (Registration Number)]* | *විස්තරය, නිෂ්පාදනය, මාදිලිය, අශ්වබල යනාදිය [Description, Make, Model, Horse Power etc.]* | *චැසි අංකය [Chassis Number]* | *එන්ජින් අංකය [Engine Number]* | *තබා ඇති ස්ථානය [Place Where kept]* |
|---|---|---|---|---|
| SP KK-0480 | මර්සිඩීස් බෙන්ස් Mercedes Benz | WDD2120472A288705 | 27186030110293 | අංක 214, බණ්ඩාරගම පාර, කැස්බෑව. |

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් මා හට පවරන ලද බලය යටතේ මා විසින්,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 22 දින ප.ව. 2.30 ට**

වාහනය තබා ඇති ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

***යෝජනා සම්මුතිය සඳහා :***
2026.05.29 දින රජයේ *ගැසට් පත්‍රය* ද, දිනපතා දිවයින, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් යන පුවත්පත්හි 2026.05.20 දින පළ වී ඇත.

***ගෙවීමේ ක්‍රමය :***
විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය :

(1) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ;
(2) පළාත් අධිකාරියේ බදු සඳහා සියයට එකක් (1%) ;
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%) ;
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 5,000/- ;
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 3,000/- ;
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

***හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :***

අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය,
ඩී.එෆ්.සී.සී. බැන්ක් පීඑල්සී,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.
දුරකථන අංක : 011 - 2371371.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 9-අයි,
හයිලෙවල් පාර,
සර්වෝදය මාවත,
පනාගොඩ,
හෝමාගම.
දුරකථන අංක : 071 4318252, 011 2173282.

07 - 99

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදාණය කරන ලද ණය අයකරගැනීමේ ( විශේෂ විධිවිධාන ) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

බම්බලපිටිය ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත (පෙර හැව්ලොක් පාර) වරිපනම් අංක 23/1 දරන පරිශ්‍රය තුළ පිහිටි පර්චස් 23.60ක් විශාලැති අගනා දේපළක්,

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිඹිරිගස්යාය කොට්ඨාසයේ, අංක 40, පිහිටි බම්බලපිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බම්බලපිටිය (කලින් හැව්ලොක් පාර), ඔස්සේ පිහිටි සම්බුද්ධත්ව ජයන්ති මාවත හි පිහිටා ඇත්තා වූ වරිපනම් අංක 23/1 දරන පරිශ්‍රයට, බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද 2015 මාර්තු මස 02 වන දිනැති අංක 13514 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කර සීමා නිර්ණය කොට ඇති ලොට් A දරන ඉඩම් කැබැල්ල සමග,

ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩී. එන්. අයි. කරුණාරත්න විසින් 2023 මාර්තු මස 09 දින සහතික කරන ලද අංක 898 දරන ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ උකස්කරයන් මත අයවිය යුතු මුදල් ගෙවීමට SIERRA COITRUCTION LIMITED ණයකරු /උකස්කරු වශයෙන් ගෙවිය යුතු මුදල් නොගෙවා පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ,

**2026ක් වූ ජූලි මස 14 වන දින ප.ව. 4.30 ට**

දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**වැඩිදුර විස්තර සඳහා**
2026.04.17.වන දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද , **2025.12.05**වන දින '' දිවයින'' '' දී අයිලන්ඩ් ''සහ තිනක්කුරල් '' යන පුවත් පත් බලන්න.
***දේපළට ප්‍රවිශ්ය වන මාර්ගය ඃ-***

බම්බලපිටිය තුංමුල්ල මංසන්ධියේ සිට හැව්ලොක් පාර ඔස්සේ මීටර් 200ක් පමණ ගමන් කර වරිපනම් අංක 23 දරන ගේට්ටුව අසළින් වමට හැරී අඩි 10ක් පළලැති පාරේ මීටර් 25ක් පමණ ගමන් කිරීමෙන් පාර අවසානයේ අදාළ දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි ඃ-

(1) ගැණුම් මුදලින් 10% ක් ද ,
(2) පළාත් පාළන ආයතන ගාස්තු වශයෙන් 1% ක්ද,
(3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බදුද,
(4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද,
(5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු.1,500/- ක්ද,
(6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ. ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව් ඒ ඩී රාමණායක මාවතේ අංක.73, ඩීඑෆ්සීසී බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකාරිනි, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න.
දූරකථන අංක.0112371371.

පී.කේ.ඊ.සේනාපති.
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දූරකථන අංක : 011-2873656, 011-2871184, 0777 672082, 0777449452,

07-34

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදාණය කරන ලද ණය අයකරගැනීමේ ( විශේෂ විධිවිධාන ) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

වව්නියාව, වයිරවපුලියකුලම් හි රාදොරෙයි පාරේ වරිපනම් අංක 15 දරන පරිශ්‍රය තුළ තබා ඇති ගාල් කර ඇති පහත සඳහන් මෝටර් රථ සහ යන්ත්‍රෝපකරණ :

| වෙසෙසි අංකය [Distinctive Number] | විස්තරය, නිෂ්පාදනය, මාදිලිය, අශ්වබල ආදිය [Description, Make, Model, horse power etc.] | චැසි අංකය [Chassis Number] | එන්ජින් අංකය [Engine Number] |
|---|---|---|---|
| WP ZB-1637 | විශේෂ කාර්ය වාහනය, ජේ.සී.බී. 3 ඩීඑක්ස් - බැකෝ ලෝඩර් 4400.00සීසී [Special Purpose Vehicle J.C.B X3DX-Backhoe Loader 4400.00 CC] | HARDXSUH02722522 | H00267427 |
| WP ZB-1635 | විශේෂ කාර්ය වාහනය, ජේ.සී.බී. 3 ඩීඑක්ස් - බැකෝ ලෝඩර් 4400.00සීසී [Special Purpose Vehicle JCB X3DX-Backhoe Loader 4400.00 CC] | HAR3DXSUE2722554 | H00267572 |

සහ

| | විස්තරය [Description] | ප්‍රමාණය [Quantity] |
|---|---|---|
| 01 | බිටුමින් ස්ප්‍රේයර් [Bitumen Sprayer] | 1 |
| 02 | බෲමර් මැෂින් (අඩි 10) [Broomer Machine (10Ft)] | 1 |
| 03 | ටිපර් ට්‍රක් කියුබ් 05 [Tipper Truck 05 Cubes] | 2 |
| 04 | ටිපර් ට්‍රක් කියුබ් 03 [Tipper Truck 03 Cubes] | 1 |
| 05 | මෝටර් ග්‍රේඩර් (අඩි 10) [Motor Grader (10ft)] | 1 |
| 06 | ස්කිඩ් ලෝඩර් [Skid Loader] | 3 |

උතුරු පළාතේ, වවුනියා දිස්ත්‍රික්කයේ, වවුනියා ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල සීමාව ඇතුළත වයිරවාපුල්ලියම්කුලම් හි රාජදූරයි පාරේ අංක 15 හි තබා ඇති (ගාල් කර ඇති) වාහන මෙහි ඉහත දැක්වෙන සෑම සියලු අමතර කොටස් මෙවලම් ආම්පන්න වර්තමානයේ හෝ මින් මතුවට කළින් කළට සවිකරන ගබඩා කර තබන්නට යෙදෙන සියලු සහ සෑම පිරියත යන්ත්‍රෝපකරණ සමාගම විසින් වරින් වර ගෙන එන්නා වූ ව්‍යාපාර කටයුතු කරගෙන යන්නා වූ ගුදම් තුළ ගබඩාවෙන් ඉවත් කර ගන්නා වූ නැවත ගෙනවිත් ගබඩා කරන්නා වූ තබන්නා වූ සෑම සියලු චංචල දේපළ හෝ නැවත ගෙන එන්නා වූ ඉවත් කර ගන්නා වූ ගබඩා කරන්නා වූ සෑම සහ හෝ සියලු දේ සමග සහ,

| අංකය [No.] | විස්තරය [Description] | අනුක්‍රමික අංකය [Serial No.] | ප්‍රමාණය [Quantity] |
|---|---|---|---|
| 01 | ඇස්ෆල්ට් ප්ලාන්ට් [Ashalt plant] | 20LT 1200 13 | 1 |

ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. එච්. වික්‍රම විසින් 2020 නොවැම්බර් මස 10 දින සහතික කරන ලද අංක 501 සහ 205, 2021 දෙසැම්බර් මස 29 දින අංක 849 සහ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. එන්. අයි. කරුණානන්ද, 2023 මාර්තු මස 09 දින සහතික කරන ලද අංක 898, 889 දරන ඩීඑෆ්සීසී නමට ලියන ලද්දා වූ උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම SIIRRA COTRUCTION LIMITED ණයකරු/ උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත

ඉහත සඳහන් දේපළ,

**2026ක් වූ ජූලි මස 14 වන දින ප.ව. 1.30 ට**

දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

***වැඩිදුර විස්තර සඳහා :-*** 2026.04.17.වන දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2025.12.05 වන දින " දිවයින'' " දී අයිලන්ඩ් ''සහ තිනක්කුරල් " යන පුවත් පත් බලන්න.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි :-

(1) ගැණුම් මුදලින් 10% ක් ද ,
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක්ද,
(3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බදුද,
(4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද,
(5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 5,000/- ක්ද,

(6) විකුනුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ගාස්තු වශයෙන් රු. 3,000/- ක් ද වේ.

ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02. ඩබ්ලිව් ඒ ඩී රාමණායක මාවතේ අංක.73, ඩීඑෆ්සීසී බැන්ක් හි ණය සම්බන්ධිකරණ කළමණාකාරිනි, ණය පුණරුජ්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න.

පී.කේ.ඊ.සේනාපති.
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු

අංක 134,
බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011-2873656, 011-2871184 , 0777 672082.
.

07-35

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - වත්තල ශාඛාව (කළින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි වාසියට, ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. සී. පී. අමරතුංග විසින් ලියා සහතික කරන ලද 2024.02.16 දිනැති අංක 888 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීම ෆාතිමා නිස්රීන් මොහොමඩ් රාවුෆ් යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ,

**වර්ෂ 2026 ජූලි මස 28 දින පෙ.ව. 10.30 ට**

එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ වත්තල - මාබෝල මහනගර සභා සීමාව තුළ 175ඒ - ඇවරිවත්ත පාර ග්‍රාම නිලධාරි වසම තුළ වත්තල පිහිටි සහ ඇවරිවත්ත පාරේ වරිපනම් අංක 0404AR202/1/3/5 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එස්. ජයලත් විසින් සාදන ලද අංක 7538 සහ 2021 ජූලි මස 12 වැනි දින දරන සහාධිපත්‍ය පිඹුරේ දැක්වෙන සහ පස්වන මහලේ පිහිටි අංක 1ඒ/එෆ්5/යූ8 දරන බෙදා වෙන්කරන ලද සහාධිපත්‍ය බද්ද නිවාස ඒක්කකයට මායිම් වශයෙන්, උතුරට: මෙම සහාධිපත්‍ය ඒකකය සහ සීඊ50, සීඊ43, ජීපී/43, සීඊ2 සහ සීඊ46 අතර බිත්තියේ මධ්‍යය ද; නැගෙනහිරට : මෙම සහාධිපත්‍ය ඒකක සහ සීඊ2, සීඊ19 සහ සීඊ20 අතර බිත්තියේ මධ්‍යය ද; දකුණට : මෙම සහාධිපත්‍ය ඒකකය සහ සීඊ2, ජීපී/35, සීඊ46 සහ සීඊ45 අතර බිත්තියේ මධ්‍යය ද; බස්නාහිරට : මෙම සහාධිපත්‍ය ඒකකය සහ 1ඒ/එෆ්5/යූ7, සීඊ46, සීඊ45 සහ සීඊ50 අතර බිත්තියේ මධ්‍යය ද; මුදුනට : 1ඒ/එෆ්6/යූ9 දරන සහාධිපත්‍ය ඒකකයේ කොන්ක්‍රීට් බිමේ මධ්‍යය සහ පහළට : 1ඒ/එෆ්4/යූ9 දරන සහාධිපත්‍ය ඒකකයේ කොන්ක්‍රීට් බිමේ මධ්‍යය ද මායිම් වූ වර්ග මීටර් එකසිය තිස් අටයි දශම තුනයි දෙක (ව.මී. 138.32)ක් විශාලත්වයෙන් යුත් බිම් ප්‍රමාණය වේ.

මෙම සහාධිපත්‍ය ඒකකයට අයත් සහාධිපත්‍ය දේපළේ පොදු උපාංගවල නොබෙදු කොටස් වටිනාකම 2.100%ක් වේ.

මෙම ඒකකයට ආසන්නතම පොදු ප්‍රවේශය සීඊ2, සීඊ9, සීඊ10, සීඊ25, සීඊ26 සහ සීඊ50 වේ.

ජීපී - 15 දරන වාහන නැවතුම් ස්ථානය සමග බලයලත් මිනින්දෝරු එස්. එස්. ජයලත් විසින් සාදන ලද අංක 7538 හා 2021 ජූලි මස 12 වැනි දින දරන එකී සභාධිපත්‍ය පිඹුරේ නිරූපණය කර ඇති සහ විස්තර කර ඇති සභාධිපත්‍ය දේපළේ ව්‍යවස්ථාපිත පොදු උපාංග ද සමග වේ.

***යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා :*** 2026.05.29 දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2026.06.11 දින දරන "ඩේලි මිරර්" "මව්බිම" සහ "තිනක්කුරල්" පුවත්පත් බලන්න.

***දේපළට පිවිසීම :***
වත්තල නගර මධ්‍යයේ සිට ඇවරියවත්ත පාරේ කි.මී. 1ක් පමණ ඉදිරියට ගමන් කර අදාළ දේපළට ළඟාවිය හැක. අදාළ දේපළ පාරේ දකුණු පසින් මාර්ගය ඉදිරිපස පිහිටා ඇත.

***ගෙවීමේ ක්‍රමය :***
වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැනුම් මුදලින් සියයට දහයක් (10%) ක් ද ;
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද ;
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු.2,000/-) ද ;
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500/-) ද ;
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැනුම් මුදලින් සියයට අනූවක් (90%) ක් මුදල, විකිණීමේ දින සිට දින තිහක් (30)ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු වේ. තව ද, දින තිහක් (30) ඇතුළත ඉතිරි මුදල නොගෙව්වහොත්, ගෙවා ඇති සියයට දහය (10%) ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා -*
ජොෂ්ඨ කළමනාකාර - ණය අධීක්ෂණ හා අය කිරීම්,
හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී.,
අංක 479,
ටී. බී. ජායා මාවත,
කොළඹ 10.
දුරකතන : 011 - 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59,
කුමාර මාවත,
පටුවත, දොඩන්දූව.
දුරකථන අංක : 071 3358434, 077 9663420
E - mail : ejayawardhana77@gmail.com

07-28

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැනුම්දීම

ණය /අයිරා යොමු අංකය : 8819738.

ගනික්කුලම, ගුවන්තොටුපල පාර හරහා ධර්මාලංකාර විහාරය අසළ දිසානායක මුදියන්සේලාගේ අමරසේන බණ්ඩාර දිසානායක මහතාගේ උකස් කරන ලද දේපළ විකිණීම.

2026.06.12 දින අංක 2493 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්පත්‍රයේ* සහ 2026.06.11 දින ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් හා යන පුවත්පත්වල පළකරන ලද ලංකා බැංකු ආඥාපනතේ 19 වන වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ලංකා බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකුණනු ලබන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයෙහි විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය එකී ස්ථානයේ දී ම,

**2026 අගෝස්තු මස 07 සිකුරාදා දින ප.ව. 1.30 ට,**

කොළොන්නාව, විහාර මාවත, අංක (50/3) හි, ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකාර එම්. එච්. ටී. කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**ඉහත සඳහන් පළමු උපලේඛනය**

උතුරු මැද පළාතේ, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, කනදර කෝරළේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 241, තම්මැන්නාපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තම්මැන්නාපුර පිහිටා ඇති "ගොඩඉඩම" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. රත්නසිරි විසින් සාදන ලද 2000 මැයි මස 05 දිනැති අංක 651 දරන පිඹුරෙහි නිරූපණය කර ඇති ලොට් 1 ලෙස ලකුණු කොට බෙදා වෙන් කළ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 1,

උතුරට : පාර (මහා මාර්ගය) ද; නැගෙනහිරට : මල්ලවආරච්චිගේ ඉඩම ද; දකුණට : රජයේ ඉඩම හා බස්නාහිරට : පන්සල් ඉඩම ද මායිම් ව අක්කර එකයි පර්චස් හතරයි දශම හතරක (අ.1, රූ.00, පර්. 4.4) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පස, ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා අංක 651 දරන එකී පිඹුරට අනුව එහි ඇති හා වැවෙන සියලු දේ සමග වේ.

එකී ලොට් 1 පහත විස්තර කර ඇති ඉඩමේ නැවත මැනුමකි.

එකී තම්මැන්නාපුර පිහිටි බෙදා වෙන් කළ ඉඩම් කැබැල්ල, උතුරට : ඉහළ මාර්ගය ද; නැගෙනහිරට : මල්ලවආරච්චිගේ ඉඩම ද; දකුණට : රජයේ ඉඩම හා බස්නාහිරට : පන්සල් ඉඩම ද මායිම්ව අක්කර එකයි පර්චස් දාහතක (අ.1, රූ.00, පර්.17) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම එහි පස, ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා එහි ඇති හා වැවෙන සියලු දේ සමඟ වේ. මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D/29/48 හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

### (වෙන්කිරීම්)

1. මෙම ඉඩම තුළ හෝ ඒ මත ඇති සියලු ඛනිජවල (මෙම යෙදුමට මෙම ප්‍රදානයේ දී වටිනා ගල් ද ඇතුළත් වේ) හිමිකම සහ කැණීමට, සෝදිසි කිරීමට, වැඩ කිරීමට හා ඒවා බැහැරට රැගෙන යාමට ඇති අයිතිය රජයට වෙන් කර ඇත.

2. මෙම ඉඩමට අයිතිකරු වශයෙන් ඇති හිමිකම මෙම ප්‍රදානය කරනු ලබන දිනයට ඉඩම මතින් ඇති මාර්ග අයිතිය හෝ ඒ මත ඇති වෙනත් පරවශතාවකට යටත් වේ.

### (කොන්දේසි)

1. අයිතිකරු විසින් ගොඩ ඉඩමෙන් හෙක්ටයාර 1/4 වශයෙන් මෙහි නම් කොට නිශ්චිතව දක්වා ඇති බිම් ප්‍රමාණයකටම වඩා අඩු උපබෙදීම් ඒකකයක් මෙම ඉඩමෙන් බැහැර නොකළ යුතු ය.

2. අයිතිකරු විසින් මෙහි නිශ්චිතව දක්වා ඇති අවම ඉඩම් කොටසට වඩා අඩු නොබෙදූ කොටසක් (1/4) බැහැර නොකළ යුතු ය.
3. කිසිවෙකුට ඉහත කොන්දේසි 1හි නිශ්චිතව දක්වා ඇති උපබෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසක අයිතිකරු විය නොහැක.

4. කිසිවකුට ඉහත කොන්දේසි 2හි නිශ්චිතව දක්වා ඇති උපබෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු නොබෙදූ කොටසක අයිතිකරු විය නොහැක.

5. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශ සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥාපනතේ (453 වන අධිකාරය) ඇති විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

6. දිසාපතිගෙන් ලිඛිතව අවසරයක් හා අදාළ අධිකාරියෙන් බලපත්‍රයක් ලබානොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යයක් හෑරීම, සෙවීම, භාවිතයට ගැනීම අයිතිකරු විසින් නොකළ යුතු ය.

7. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබානොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතු ය.

*ගෙවීම් කරන ආකාරය :-*
වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් සිදු කළ යුතුය :

1.1 ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
1.2 වැට් (VAT) බදු අයකර ගැනීම් (අදාළ වේ නම්) ද,
1.3 විකුණුම් බද්ද ලෙස පළාත් පාලන අධිකාරියට 1% (සියයට එකක්) ද,
1.4 වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස 2.5% (සියයට දෙකයි දශම පහක්) ද,
1.5 විකුණුම් පිරිවැය සහ වෙනත් අයකර ගැනීම් වෙතොත් ඒ සැම,
1.6 වෙනත් ගාස්තු/අයකරගැනීම් ද,

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැනුම් මිලෙන් තවත් 10% (සියයට දහයක්) ද, ගැනුම් මිලේ ඉතිරි 80% විකුණනු ලබන දිනයේ සිට මාස තුනක් ඇතුළත ද පියවිය යුතුය. ඊට අමතරව විකිණීමේ කොන්දේසි ගිවිසුම සහ විකුණුම් සහතික සඳහා මුද්දර බදු සහ නොතාරිස් ගාස්තු ද ගැනුම්කරු විසින් ගෙවිය යුතුය.

ඉහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට ගැනුම්කරු අපොහොසත් වන්නේ නම් වෙන්දේසි දිනයේදී ගෙවන ලද සියලු මුදල් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ අයිතිය බැංකුව සතුය.

*දේපළට ප්‍රවේශ වන ආකාරය:-*
අනුරාධපුර කච්චේරිය හන්දියේ සිට ගුවන් තොටුපළ මාර්ගයේ (බණ්ඩාරනායක මාවත ලෙස ද හඳුන්වන) කිලෝමීටර් 8 ක් පමණ ගමන් කළ විට ශ්‍රී ධර්මාලංකාර පුරාණ විහාරස්ථානය හමුවේ. පන්සලට යාබදව සහ ඊට පසුව, මාර්ගයේ දකුණු පසින් අදාළ ඉඩම පිහිටා ඇති අතර ඉඩමක මායිම පාරට මුහුණලා ඇති දිග ප්‍රමාණය අඩි 80 කි.

"ලංසුකරුවන්ට ඉහත සඳහන් දේපළට අදාළ හිමිකම් ඔප්පු හා වෙනත් සම්බන්ධිත ලේඛන 0114612617 යන දුරකථන අංකය ඔස්සේ ලංකා බැංකුවේ බොරැල්ල අධිශ්‍රේණි ශාඛාවේ කළමනාකරු හා සම්බන්ධ වී පරීක්ෂා කිරීමට නිදහස ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

එම්. ජී. යූ. ශනිප්‍රිය,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
බොරැල්ල අධිශ්‍රේණි ශාඛාව.

06 - 96

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඒ. එල්. ඒ. පී. පෙරේරා.
ගිණුම් අංකය : 1212 5743 8472

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2025.10.21 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අසූ අට ලක්ෂ හතළිස් දහස් පන්සිය අසූ හතරයි ශත පනහක (රු. 8,840,584.50) මුදල ද, 2025 සැප්තැම්බර් මස 23 දින සිට අංක 2692 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට එක් ලක්ෂ පනස් හත් දහස් හත්සිය හැට හතයි ශත අසූ නවයක (රු. 6,157,767.89) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම බිංදුවක් (13.0%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2026.03.20 දින රජයේ *ගැසට් පත්‍රයේ* හා 2026.03.19 දින “දිවයින”, “තිනකුරල්” සහ “අයිලන්ඩ්” දිනපතා පුවත්පත්‍රවල පළකොට ඇති පරිදි,

**2026.08.28 දින පෙ.ව. 11.00 ට,**

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ පහළ කරගහමුන උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පහළ කරගහමුන ග්‍රාමයේ පිහිටි "මිල්ලගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. එම්. කේ. පෙරේරා යන අය විසින් සාදන ලද 2018 මාර්තු මස 17 දාතම හා අංක 587 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර; නැගෙනහිරට : අංක 324/2007 දරන පිඹුරේ නිරූපිත ලොට් 5 (මීටර් 3.6 පළල පාර); දකුණට : අංක 324/2007 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 සහ බස්නාහිරට: අංක 1144 පිඹුරේ නිරූපිත ලොට් 49 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම තුනයි බිංදුවක් (පර්. 18.30) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 587 දරන පිඹුරට අනුව ය.

අංක 587 දරන එකී පිඹුරේ නිරූපිත එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී පහළ කරගහමුන ග්‍රාමයේ පිහිටි "මිල්ලගහවත්ත" යයි කියන ඉඩමට බලයලත් මානක තැන ජී. එම්. කේ. පෙරේරා යන අය විසින් සාදන ලද 2007 ඔක්තෝබර් මස 20 දාතම හා අංක 324/2007 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර; නැගෙනහිරට : ලොට් 5 (පාර); දකුණට : ලොට් 4 සහ බස්නාහිරට : අංක 1144 පිඹුරේ නිරූපිත ලොට් 49 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම තුනයි බිංදුවක් (පර්. 18.30) විශාල ඉඩම් කොටස එකී අංක 324/2007 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව M 635/81 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 327/2007 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 5 දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද ඒ හා බැඳුන වෙනත් අයිතීන් ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-90

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඒ. පී. ගෝවින්න
ගිණුම් අංක : 0060 5001 7158

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2026.02.19 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අසූ පන් ලක්ෂ හැත්තෑ හත් දහස් හයසිය අසූ තුනයි ශත නවයක (රු. 85,77,683.09) මුදල ද, 2026 පෙබරවාරි මස 02 දින සිට අංක 4507 උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අසූ පන් ලක්ෂ තිස් හත් දහස් දෙසිය හතළිස් හතරයි ශත දොළහක (රු. 85,37,244.12) මුදලක් සඳහා වාර්ෂිකව සියයට අටයි දශම බිංදුවක් (8.0%) බැගින් වූ පොළිය ද දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2026.04.02 දින රජයේ *ගැසට් පත්‍රයේ* හා 2026.03.25 දින "දිවයින", "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි,

**2026.08.24** දින ප.ව. **1.30** ට,

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ශාන්තාලෝකගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කොරතොට ග්‍රාමයේ පිහිටි එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, 6 වන පටුමග, වරිපනම් අංක 26 දරන "වනපොතු මූකලාන *නොහොත්* වයිවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්. තෙපුලන්ගොඩ යන අය විසින් සාදන ලද 2000 අගෝස්තු මස 13 දාතම හා අංක 1259 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 57A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අඩි 20 පළල පාර; නැගෙනහිරට: P. P. fld. 7083 දරන පිඹුරේ ලොට් 56; දකුණට: ලොට් 57B; සහ බස්නාහිරට : ලොට් 57E යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම දෙකයි බිංදුවක් (පර්. 10.20) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග අංක 1259 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව B 594/105 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති අංක 904 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 58B (අඩි 7 පළල පාර) දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද ඒ හා බැඳුන වෙනත් අයිතීන් ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-89

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩබ්ලිව්. ඒ. ඩී. වික්‍රමසේකර සහ ඒ. ඒ. එස්. එස්. ජයවර්ධන
ගිණුම් අංක : 1198 5212 4714/ 0198 5000 5381

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2026.02.19 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි හැට නව ලක්ෂ අනූ තුන් දහස් හත්සිය තිස් හතයි ශත අනූ දෙකක (රු. 16,993,737.92) මුදල ද, 2026 පෙබරවරි මස 02 දින සිට අංක 4410, 106 සහ 139 උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් එක් ලක්ෂ දහ නව දහස් අටසිය හැත්තෑ එකයි ශත අනූ හතක (රු. 5,119,871.97) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම බිංදුවක් (14.0%) හා තවත් රුපියල් එක් කෝටි හත් ලක්ෂ පනස් හතර දහස් හයසිය හැත්තෑ හතරයි ශත හැත්තෑ තුනක (රු. 10,754,674.73) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Monthly Average Weighted Prime Lending Rate + Three decimal Naught *per centum* (AWPLR + 3.0%) per annum බැගින් වූ පොළිය ද දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත්

තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2026.04.02 දින රජයේ *ගැසට් පත්‍රයේ* හා 2026.03.25 දින "දිවයින", "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි,

**2026.08.19 දින පෙ.ව. 10.00 ට,**

පිහිටි ස්ථානයේ දී මෙසස් ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් බලයලත් වෙන්දේසිකරුවන් වන එම්. එච්. ටී. කරුණාරත්න යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, යටිගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ කොටදෙණියාව - අංක 54B දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කොටදෙණියාව ග්‍රාමයේ පිහිටි "බර්මිංටන් එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. එස්. කේ. හේරත් විසින් සාදන ලද 2016 මැයි මස 13 දාතම හා අංක 4392 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: මෙම ඉඩම්වල ලොට් 27 සහ ලොට් 29 සහ ලොට් 82 (පාර); නැගෙනහිරට : මෙම ඉඩම්වල ලොට් 29, 27 සහ 32; දකුණට: මෙම ඉඩමේ ලොට් 81 (පාර) සහ ලොට් 32 සහ බස්නාහිරට : ලොට් 81 (පාර) සහ 82 (පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හයයි දශම අටක් (පර්. 26.8) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග අංක 4392 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව J 171/124 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 469 දරන පිඹුරේ ලොට් 2 සහ අංක 4280 දරන පිඹුරේ නිරූපිත ලොට් 81, 82, 84, 86 සහ 83 යන සියල්ල දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද ඒ හා බැඳුන වෙනත් අයිතීන් ද සමග ය.

***ප්‍රවේශ වීම :-*** දිවුලපිටිය නගරයේ සිට කුරුණෑගල පාර ඔස්සේ කිලෝ මීටර් 9.2ක් (කොටදෙනියාව හන්දියෙන් මීටර් 260ක් පමණ) ඉදිරියට ගොස් අරලිය මිඩ්සිටි පාරට (හරස් පාර) දකුණට හැරී මීටර් 110ක් පමණ ඉදිරියට ගමන් කොට වම් පසින් ඇති දේපළට ළඟා වන්න.

***ගෙවීම් කිරීම :-*** වෙන්දේසි මිටිය පහළ වැටී මිළ තීන්දුවනවාත් සමග සාර්ථක ගැනුම්කරු පහත සඳහන් මුදල් ප්‍රමාණයන් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ක් ද ;
2. අදාළ දේශීය අධිකාරියට ගෙවිය යුතු දේශීය බද්ද සියයට එකක් (1%) ද ;
3. වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් සියයට දෙකයි දශම පහක් (2.5%) ද ;
4. අදාළ නම් වැට් ගාස්තු ද ;
5. වෙනත් අදාළ ගාස්තු සහ අය කිරීම් ද ;
6. ශ්‍රී ලංකා රජය හෝ වෙනත් අධිකාරියක් විසින් පනවන ලද ඕනෑම ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, බදු හො වෙනත් ගාස්තු සමග ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකුණුම් දිනයේ සිට දින 30ක් ඇතුළත පියවිය යුතු ය.

නිශ්චය කොට ඇති කාල පරිච්ඡේදය තුළ ඉතිරි මුදල පියවීමට අපොහොසත් වුවහොත්, 10% මූලික ගෙවීම අහිමි කොට වැඩිමනක් දැනුම් දීමකින් තොරව දේපළ නැවත විකිණීමට බැංකුවට හිමිකම් ඇත.

ඇමතුම් විස්තර:

*වැඩිමනත් තොරතුරු සඳහා කරුණාකර අමතන්න :*
අයකරගැනීම් දෙපාර්තමේන්තුව,
සම්පත් බැංකුව පීඑල්සී,
අංක 110,
ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 02.
දුරකථන : 011-441 6237/ 077-1875651.

පූර්ව දැනුම්දීමකින් තොරව, වෙන්දේසිය තාවකාලිකව අත්හිටුවීමට, කල්තැබීම, හෝ අවලංගු කිරීම බැංකුව සතු හිමිකම් වේ.

වෙන්දේසිකරුගේ නම
එම්. එච්. ටී. කරුණාරත්න,
මෙසස් ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි බලයලත් වෙන්දේසිකරු.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-88

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඒ. ඩබ්ලිව්. ඩී. නන්දප්‍රිය
ගිණුම් අංකය : 1074 5792 5635

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2025.08.13 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එක් කෝටි පනස් එක් ලක්ෂ හැත්තෑ දහස් එකසිය විසි හයයි ශත පනස් හතරක (රු. 15,170,126.54) මුදල ද, 2025 මැයි මස 19 දින සිට අංක 2928, 1264 සහ 3068 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් එක් කෝටි තිස් එක් ලක්ෂ හැට තුන් දහසක (රු. 13,163,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවයි දශම පහයි බිංදුවක් (15.50%) බැගින් වූ පොළිය ද දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2026.02.27 දින රජයේ *ගැසට් පත්‍රයේ* හා 2026.02.24 දින “දිවයින”, “තිනකුරල්” සහ “අයිලන්ඩ්” දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි,

**2026.08.31 දින පෙ.ව. 11.00 ට,**

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පානදුර නගර සභා සීමාවන් තුළ වලපොලපට්ටිය, අංක 683 A දරන ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ වලපොලපට්ටිය පිහිටි "දෙල්ගහවත්ත සහ පල්ලියවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. පී. ඒ. ජයවික්‍රම විසින් සාදන ලද 2009 දෙසැම්බර් මස 20 දාතම හා අංක 12261 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට: අංක 8234 දරන පිඹුරේ ලොට් 5A1; නැගෙනහිරට : ලොට් 6; දකුණට: එස්. පියසේනගේ ඉඩම දැනට පවත්නා පාර සහ බස්නාහිරට : එස්. පියසේන සහ කොරනේලිස්ගේ ඉඩම දැනට පවත්නා පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නවයක් (පර්. 9) හෝ හෙක්ටයාර 0.02276 ක් විශාල ඉඩම් කොටස සහ ඩයස් පෙදෙස, වරිපනම් අංක 114/34 දරන පරිශ්‍රයන් ද සමඟ පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 12261 දරන පිඹුරට අනුව වෙළුම /පත්‍රිරුව D 713/90 (වෙනත් විස්තර තිරුව) යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඉහත ඉඩම පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි:

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පානදුර නගර සභා සීමාවන් තුළ, වල්පොලපට්ටිය, අංක 683A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වල්පොලපට්ටිය පිහිටි "දෙල්ගහවත්ත සහ පල්ලියවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එල්. ඩී. එල් ද සිල්වා විසින් සාදන ලද 1990 සැප්තැම්බර් මස 12 දාතම හා අංක 8235 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 5B සහ 5A2 වශයෙන් ලකුණු කොට ඇති ඒකාබද්ධ ඉඩම් කොටස්වලට මායිම්, උතුරට : අංක 8234 දරන පිඹුරේ ලොට් 5A1; නැගෙනහිරට : ලොට් 6; දකුණට : එස්. පියසේනගේ ඉඩම දැනට පවත්නා පාර සහ බස්නාහිරට : එස්. පියසේන සහ කොරනේලිස්ගේ ඉඩම දැනට පවත්නා පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නවයක් (පර්. 9) හෝ හෙක්ටයාර 0.02276 ක් විශාල ඉඩම් කොටස සහ ඩයස් පෙදෙස, වරිපනම් අංක 114/34 දරන පරිශ්‍රයන් ද සමඟ පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 8235 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D713/90 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමඟ ය.

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යල කොට්ඨාසයේ, පානදුර නගර සභා සීමාවන් තුළ වල්පොලපට්ටිය අංක 683A ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වල්පොලපට්ටිය පිහිටි "දෙල්ගහවත්ත සහ පල්ලියවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් සාදන ලද 1977 මැයි මස 09 දාතම හා අංක 1519 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් R6 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : එච්. දිනෝරිස් විසින් හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: පී. ඩබ්ලිව්. අපොන්සෝ සහ නෙස්ලින් ෆොන්සේකා විසින් හිමිකම් කියන ඉඩම්; දකුණට: වලපල පන්සලේ ඉඩම සහ බස්නාහිරට : ලොට් R8, 09, R3 10, R5, 21, 22 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් එකක් (පර්. 31) විශාල ඉඩම් කොටස සමග, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1519 දරන පිඹුරට අනුව වෙළුම පත්‍රිරුව D 474/128 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පානදුර නගර සභා සීමාවන් තුළ, වලපොලපට්ටිය, අංක 683A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වලපොලපට්ටිය පිහිටි "දෙල්ගහවත්ත සහ පල්ලියවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් සාදන

ලද 1977 මැයි මස 09 දාතම හා අංක 1519 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් R3 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : ලොට් R2, 05, 06, 07, 09; නැගෙනහිරට : ලොට් R6, 14, 15; දකුණට : ලොට් 10, 11, 12, R4, 13, 14, 04 සහ ඊ. ජිනෝරිස් සහ එස්. පියසේන විසින් හිමිකම් කියන ඉඩම්; බස්නාහිරට : ලොට් 03 සහ 04 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් තුනයි දශම හතරක් (පර්. 33.4) විශාල ඉඩම් කොටස සමඟ පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1519 දරන පිඹුරට අනුව වෙළුම / පත් ඉරුව D 718/53 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පානදුර නගර සභා සීමාවන් තුළ, වලපොලපට්ටිය, අංක 683A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වලපොලපට්ටිය පිහිටි "දෙල්ගහවත්ත සහ පල්ලියවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයත් මානක තැන ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් සාදන ලද 1977 මැයි මස 09 දාතම හා අංක 1519 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් R2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට: බී. ජී. පෙරේරාගේ ඉඩම, ලොට් R7; නැගෙනහිරට: ලොට් 05; දකුණට ලොට් R3 සහ බස්නාහිරට : ලොට් 02, R1 සහ 03 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම දෙකයි පහක් (පර්. 7.25) විශාල ඉඩම් කොටස සමඟ, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1519 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D718/50 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

4. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පානදුර නගර සභා සීමාවන් තුළ, වලපොලපට්ටිය, අංක 683 A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වලපොලපට්ටිය පිහිටි "දෙල්ගහවත්ත සහ පල්ලියවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් සාදන ලද 1977 මැයි මස 09 දාතම හා අංක 1519 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් R7 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට: ඩයස් පෙදෙස; නැගෙනහිරට : ජේ. ඩී. පෙරේරාගේ සහ වෙනත් අයගේ ඉඩම; දකුණට : ලොට් R2 සහ බස්නාහිරට : බී. ජී. පෙරේරාගේ ඉඩම, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම දෙකයි පහක් (පර්. 2.25) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1519 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D 713/98 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

5. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පානදුර නගර සභා සීමාවන් තුළ, වලපොලපට්ටිය, අංක 683A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වලපොලපට්ටිය පිහිටි "දෙල්ගහවත්ත සහ පල්ලියවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් සාදන ලද 1978 මාර්තු මස 03 දාතම හා අංක 1555 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට: ඩයස් පෙදෙස; නැගෙනහිරට : ලොට් 3; දකුණට : අංක 1519 දරන පිඹුරේ ලොට් R6 සහ බස්නාහිරට : ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම හතයි පහක් (පර්. 1.75) විශාල ඉඩම් කොටස සමඟ පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1555 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D 713/91 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-86

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. එම්. එස්. කුමාර. සහ එල්. එම්. එස්. ප්‍රේමලතා
ගිණුම් අංකය : 0074 5000 8510

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2025.10.21 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙකෝටි දහ අට ලක්ෂ විසි දෙදහස් හාරසිය පනස් අටයි ශත හතළිස් හතරක (රු. 21,822,458.44) මුදලද, 2025 සැප්තැම්බර් මස 26 දින සිට අංක 2480 උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්

රුපියල් අනූ තුන් ලක්ෂ අසූ හත් දහස් හයසිය හැට එකයි ශත පනස් හතක (රු. 9,387,661/57) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහයි බිංදුවක් (12.50%) හා තවත් රුපියල් හැට ලක්ෂ අසූ හය දහස් අටසිය අසූ හතරයි ශත තිස් හතක (රු. 6,086,884.37) මුදලක් සඳහා වාර්ෂිකව සියයට හයයි දශම නවයයි තුනක් (6.93%) බැගින් වූ පොළිය ද දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2026.02.20 දින රජයේ *ගැසට් පත්‍රයේ* හා 2026.02.17 දින ''දිවයින'', ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි,

**2026.08.06 දින පෙ.ව. 11.00 ට,**

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කුඹුක්කන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, 14 වන සැතපුම් කණුව ග්‍රාමයේ පිහිටි ''වැවේමූකලාන'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. එම්. ඩබ්ලිව්. ඩී. දිසානායක යන අය විසින් සාදන ලද 2017 නොවැම්බර් මස 07 දාතම හා අංක 4012 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : හෙන්ද්‍රික් අප්පුහාමි විසින් හිමිකම් කියන ඉඩම සහ කනත්ත; නැගෙනහිරට : කනත්ත සහ පාර; දකුණට: පාර සහ බස්නාහිරට: පාර සහ හෙන්ද්‍රික් අප්පුහාමි විසින් හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විස්සක් (අ.1, රූඩ්. 3, පර්. 20) හෝ හෙක්ටයාර 0.7586 ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමඟ එකී අංක 4012 දරන පිඹුරට අනුව වෙළුම පත්‍රිරුව LDO/A 20/134 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 4012 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී 14 වන සැතපුම් කණුව ග්‍රාමයේ පිහිටි "වැවේමූකලාන" යයි කියනු ලබන ඉඩමට මායිම් උතුරට : කනත්ත; නැගෙනහිරට: අතුරු පාර දිගේ වෙන් කිරීම; දකුණට : අතුරු පාර දිගේ වෙන් කිරීම සහ බස්නාහිරට : කේ. එම්. හෙන්ද්‍රික් විසින් හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අක්. 2) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ වෙළුම/පත්‍රිරුව LDO/A 22/164 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-85

---

**මහජන බැංකුව - කිරිබත්ගොඩ ශාඛාව**

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 D වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 275A, හෙයියන්තුඩුව දකුණ ග්‍රාම නිලධාරි වසමේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හෙයියන්තුඩුව ග්‍රාමයේ පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. යූ. ඩී. රණසිංහ මහතා විසින් 2015.10.23 වැනි දින මැන සාදන ලද අංක 3177 දරන පිඹුරේ ලොට් අංක 1 ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : රූඩ් 1, පර්. 2 ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි, වගාවන් සහ සියලු දේ ද වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක N 526/13 හි ලියාපදිංචි කර ඇත. ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන්කළ කොටස්වල මාර්ග අයිතිය ද වේ.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින්,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 22 බදාදා දින පෙ.ව. 11.00ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

***දේපළ වෙත පිවිසීම -:*** සපුගස්කන්ද තෙල් පිරිපහදු හන්දියේ සිට කි.මී. 1 ක් පමණ සමෘද්ධි මාවතේ ගියවිට දකුණු පසට ඇති මාබිම පාරේ කිලෝමීටර් 1.3ක් මහින්ද මහා විද්‍යාලය දක්වා ගිය පසු වමපසට ඇති ඔබයවත්ත පාරේ මීටර් 250ක් ගියවිට ඔබයවත්ත හන්දිය පසුකර ඉදිරියට ඇති ශ්‍රී දේවමිත්ත පාරේ මීටර් 35ක් පමණ ගියවිට පාරේ දකුණුපසින් අදාළ දේපළ පිහිටා ඇත. මෙම දේපළ අංක 205A, ලිපිනය ඇති නිවසට යාබදව පිහිටා ඇත.

***තීරණය පිළිබඳ දැන්වීම :-***
කරුණාකර 2020.09.25 දින පළකරන ලද රජයේ *ගැසට් පත්‍රය* සහ ඩේලි නිවුස්, දිනමිණ සහ තිනකරන් යන පුවත්පත් බලන්න.

***ගෙවීමේ ක්‍රමය :-***
මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් (සියයට එකක) විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% (සියයට දෙකහමාරක්) සහ එම කොමිස් මුදලට අදාළ සියලුම බදු ;
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500/- ;
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් නම් එම ගෙවීම්;
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු

ගැනුම් මිලෙන් 90% (සියයට අනූවක්) වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කළමනාකාර, මහජන බැංකුව, කිරිබත්ගොඩ ශාඛාව වෙත ගෙවිය යුතු වේ.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10%ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් විස්තර පහත ලිපිනයෙන් ලබාගත හැක :
ප්‍රාදේශීය කළමනාකාර,
මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131,
නුවර පාර,
බැලුම්මහර, මුදුන්ගොඩ.
දුරකතන අංක : 033 2222325, 033 2225008, 033 2231901

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය."

**ශොක්මන් සහ සමරවික්‍රම,**
"එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්."

**ප්‍රධාන කාර්යාලය**
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර.
දුරකථන අංකය :-081-2227593.
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371.
ඊමේල් :- info@samera1892.com

**නගර කාර්යාලය**
අංක 6A, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08.
දුරකථන අංක : 011 2671467, 011 2671468.
දුරකථන/ෆැක්ස් අංක : 011 2671469.
ඊමේල් : schokman@samera1892.com
වෙබ් අඩවිය : www.sandslanka.com

07-26

---

**මහජන බැංකුව - ආයතනික ශාඛාව**

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත
1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 D වගන්තිය
යටතේ විකිණීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමා තුළ වෙල්ලවීදිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලුත්කඩේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අලුත්කඩේ නැගෙනහිර පිහිටි මීරානියා වීදිය වරිපනම් අංක 275 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් සකස් කළ 2006.11.05 දිනැති අංක 57-2006 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කළ ලොට් 3 වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ ඉඩම් කොටස,

ඉඩමේ ප්‍රමාණය අක්. 1, රූඩ් 1, පර්. 12.84 ඒ මත පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියලු දේද වේ. අංක 57-2006 දරන පිඹුරෙහි නිරූපිත එකී ලොට් අංක 3 පහත සඳහන් වන ඉඩම් කොටසෙහි නැවත මිනුමක් වන්නේ ය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමා තුළ කෙසෙල්වත්ත මැතිවරණ කොට්ඨාස අංක 18, අලුත්කඩේ නැගෙනහිර මැතිවරණ කොට්ඨාස අංක 16 හි පිහිටි ශ්‍රී සංඝරාජ මාවත, වරිපනම් අංක 387 සහ මීරානියා වීදිය වරිපනම් අංක 275 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් සකස් කළ 1999.06.25 දිනැති අංක 1742 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම් කොටස.

ඉඩමේ ප්‍රමාණය අක්. 1, රූඩ් 1, පර්. 12.84,

ඉහත කී අංක 1742 දරන පිඹුරෙහි එකී ලොට් අංක 3 පහත සඳහන් වන ඉඩම් කොටසෙහි නැවත මිනුමක් වන්නේය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමා තුළ කෙසෙල්වත්ත මැතිවරණ කොට්ඨාසයේ අලුත්කඩේ නැගෙනහිර පිහිටි ශ්‍රී සංඝරාජ මාවත වරිපනම් අංක 387 සහ මිරානියා වීදිය වරිපනම් අංක 275 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු එස් රාජේන්ද්‍ර විසින් සකස් කළ 1969.03.14 දිනැති අංක 3543 දරන පිඹුරේ නිරූපිත ලොට් D වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ ඉඩම් කොටස,

ඉඩමේ ප්‍රමාණය : අක්. 1, රූඩ් 1, පර්. 11.56, මෙම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ D39/142 හි ලියාපදිංචි කර ඇත.

අදාළ දේපළ දයා ඇපරල් එක්ස්පෝර්ට් පුද්ගලික සමාගම විසින් මහජන බැංකුවට උකස් කරන ලද්දකි.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින්,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 20 සඳුදා දින පෙ.ව. 11.00 ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

***දේපළ වෙත පිවිසීම :-***
මරදාන කාර්මික විද්‍යාල හන්දියේ සිට ආමර් වීදිය දෙසට ශ්‍රී සංඝරාජ මාවතේ මීටර් 650ක් පමණ ගියවිට DSL හන්දිය හමුවේ. එම මාවතේ තවත් මීටර් 225ක් පමණ ගියවිට අදාළ දේපළ පිහිටා තිබේ.

***තීරණය පිළිබඳ දැන්වීම :-***
කරුණාකර 2021.04.16 දින පළකරන ලද රජයේ *ගැසට් පත්‍රය* සහ ඩේලි නිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත් බලන්න.

***ගෙවීමේ ක්‍රමය :-***
මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් (සියයට එකක) විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% (සියයට දෙකහමාරක්) සහ එම කොමිස් මුදලට අදාළ සියලුම බදු ;
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500/- ;
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් නම් එම ගෙවීම්;
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු

ගැනුම් මිලෙන් 90% (සියයට අනූවක්) වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සහකාර සාමාන්‍යාධිකාරි (අයකිරීම්), මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, 12 වන මහල, අංක 374, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02 වෙත ගෙවිය යුතු වේ.

දුරකථන අංක : 011 3741215, 011 3741273

ඔප්පුව පිළිබඳ සහ අනෙකුත් විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10%ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය."

**ෂොක්මන් සහ සමරවික්‍රම,**
"එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්."

**ප්‍රධාන කාර්යාලය**
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර.
දුරකථන අංකය : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371,
ඊමේල් :- info@samera1892.com

**නගර කාර්යාලය**
අංක 6A, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08.
දුරකථන අංක : 011 2671467, 011 2671468,
දුරකථන/ෆැක්ස් අංක : 011 2671469,
ඊමේල් :- schokman@samera1892.com
වෙබ් අඩවිය :- www.sandslanka.com

07-51

---

**ඩී එෆ් සී සී බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ, ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. එස්. ආර්. ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද 2017.06.30 දිනැති අංක 1257 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, මාලඹේ පදිංචි වීරසිංහ ආරච්චිගේ තිවංක ප්‍රගීත් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 476A මාලඹේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාලඹේ ගමේ පිහිටි "කෝන්ගහවත්ත" නමැති ඉඩමට බලයලත්

මිනින්දෝරු ඩී. ඩබ්ලිව්. අබේසිංහ විසින් සාදන ලද 1991.12.10 දිනැති අංක 4022 දරන මැනුම් පිඹුරේ ලොට් 3B1 වශයෙන් ලකුණුකොට, බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහතුනක් (පර්. 13) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 118/45 හි ලියාපදිංචි කර ඇත.

පහත දැක්වෙන පාරක් සඳහා වූ වෙන් කිරීම භාවිතා කිරීමේ අයිතිය ද සමග වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කොරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 476A මාලඹේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාලඹේ ගමේ පිහිටි "කෝන්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එස්. කුරුප්පු විසින් සාදන ලද 1988.06.23 දිනැති අංක 790 දරන මැනුම් පිඹුරේ ලොට් 3D වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහයක් (පර්. 10) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 28 දින පෙ.ව. 9.30 ට**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

***දේපළට පිවිසීම :-***

මාලඹේ ඔරලෝසු කණුව මංසන්ධියේ සිට කඩුවෙල පාර ඔස්සේ මීටර් 180ක පමණ දුරක් ගොස් මාලඹේ පිරිමි පාසලට මීටර් 50කට ප්‍රථම වම්පසට ඇති අඩි 10ක් පළල ඇති මාර්ගයට හැරී තවත් මීටර් 75ක පමණ දුරක් ගියවිට මාර්ගය අවසානයට පෙර අංක 397/2 දරන අදාළ දේපළ මාර්ගයේ දකුණුපසින් මාර්ගයට මුහුණලා පිහිටා ඇත.

***යෝජනා සම්මුති දැන්වීම :-***

රජයේ *ගැසට් පත්‍රයේ* 2023.11.24 දින පළ වී ඇති අතර, දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත්වල 2023.11.17 දින පළ වී ඇත.

***ගෙවීමේ ක්‍රමය :-***

සාර්ථක ගැනුම්කරු විසින් මිටිය පහත හෙළා වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසිකරු වෙත පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) ;
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000/-;
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 2,000/- ;
6. සියලුම ප්‍රචාරක වියදම් ;
7. ගැනුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වේනොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

***වැඩි විස්තර සඳහා විමසන්න :***

අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය,
ඩී.එෆ්.සී.සී. බැන්ක් පීඑල්සී,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.
දුරකථන අංක : 011 2371371

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය.

තුසිත් කරුණාරත්න,
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 011 3068185, 011 2572940

07-66

---

**ඩී එෆ් සී සී බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ, ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. ඒ. ටී. අල්විස් විසින් ලියා සහතික කරන ලද 2018.04.04 සහ 2020.10.26 දිනැති අංක 1751 සහ අංක 2522 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, සිය ලියාපදිංචි කිරීමේ කාර්යාලය කලුතර පවත්වාගෙන යන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද PV 18180 දරන සේෆ් හවුස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ මහවිදානගේ උපුල් සුදත් අමරසිංහ *හෙවත්* මහදුරගේ උපුල් සුදත් අමරසිංහ විසින් පැහැර හැර ඇති හෙයින් ද,

01. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර බද්දේ, කළුතර තොටමුණ උතුර කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුතර ප්‍රාදේශීය සභා බලසීමාව තුළ අංක 723E තේක්කවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පන්විල පිහිටි පන්විලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. අයි. එන්. පෙරේරා විසින් සාදන ලද 2006.08.02 දිනැති අංක 3669 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1හි නැවත මැනීමක් සහ උප බෙදීමක් වන, බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2006.08.09 දිනැති අංක 3670 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1A වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 3670 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම අටයි පහක් (පර්. 11.85) විශාල ඉඩම එහි පිහිටි පස, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

02. ඉහත කී පන්විල පිහිටි පන්විලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2006.08.02 දිනැති අංක 3669 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1හි නැවත මැනීමක් සහ උප බෙදීමක් වන, බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2006.08.09 දිනැති අංක 3670 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1B වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 3670 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහයක් (පර්. 10) විශාල ඉඩම එහි පිහිටි පස, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

03. ඉහත කී පන්විල පිහිටි පන්විලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2006.08.02 දිනැති අංක 3669 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1හි නැවත මැනීමක් සහ උප බෙදීමක් වන, බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2006.08.09 දිනැති අංක 3670 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1C වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 3670 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහයක් (පර්. 10) ක් විශාල ඉඩම එහි පිහිටි පස, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

04. ඉහත කී පන්විල පිහිටි පන්විලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2006.08.02 දිනැති අංක 3669 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2හි නැවත මැනීමක් සහ උප බෙදීමක් වන, බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2006.08.10 දිනැති අංක 3671 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2A වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 3671 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහයක් (පර්. 10) විශාල ඉඩම එහි පිහිටි පස, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

පහත විස්තර කරනු ලබන ඉඩම මතින් වන මාර්ග අයිතිය සහ අනෙකුත් අයිතීන් ද සමග වේ.

උකස්කරුට ඔහුගේ ආගන්තුකයන්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහනිර්මාණ ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයින්ට, කුලී නිවැසියන්ට, අවසරලාභීන්ට සහ ආරාධිතයන්ට මින් මතු සෑම වේලාවකම ඔවුන්ගේ අභිප්‍රාය හා කැමැත්ත පරිදි කවර කාර්යයක් සඳහා වුව ද දිවා හෝ රාත්‍රී කාලයේ දී පා ගමනින් හෝ වෙනත් ඕනෑම ආකාරයකින් අශ්වයින්, ගවයින් හෝ වෙනත් සතුන් ඇතිව හෝ නොමැතිව මෝටර් කාර්, ලොරි සහ වෙනත් සෑම ආකාරයකම වාහන මගින් බර පටවා හෝ නොපටවා මෙහි විශේෂයෙන් විස්තර කළ මාර්ග තුළින් මතින් හෝ ඔස්සේ සෑම කල්හිම යාමට ඊමට සහ ප්‍රත්‍යාගමනය කිරීමට ද, ඇතුළුවීමට හෝ පිටවීමට ද පූර්ණ හා බාධා විරහිත අයිතිවාසිකම් නිදහස හා අවසරයද, එම බිම මඟින්, තුළින් සහ/හෝ ඔස්සේ සහ ඉහළින් විදුලි කේබල් මුදුන් කම්බි, ජලාපවහන, ගෑස් සහ ජලනල එළීමේ හා වෙනත් කවර වූ හෝ ආකාරයක උවාරණ හා උපක්‍රම යෙදීමේ අයිතියද ඇතුළත් ව,

ඉහත කී පන්විල පිහිටි පන්විලවත්ත ලොට් B නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2006.08.02 දිනැති අංක 3669 දරන පිඹුරේ දැක්වෙන ලොට් 5 (පාරක් සඳහා වූ වෙන් කිරීම) වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 3669 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහඅටයි දශම නවයයි බිංදුවක් (පර්. 18.90) ක් හෝ හෙක්ටයාර 0.0479ක් විශාල ඉඩම වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 24 දින පෙ.ව. 10.00 ට**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

***දේපළට පිවිසීම :***

කළුතර බස්නැවතුම්පලේ සිට කළුතර - පලාතොට පාර ඔස්සේ කි.මී. 3ක පමණ දුරක් ගොස් පන්විලහේන මංසන්ධිය දක්වා පැමිණ දකුණු පසට ඇති පන්විලහේන මාර්ගයට හැරී (විසුදා ආයුර්වේද මධ්‍යස්ථාන පාර) තවත් මීටර් 100-200ක පමණ දුරක් ගොස් එම්. යූ. සුදත් අමරසිංහ මහතාගේ ඉඩම් දක්වා ගියවිට අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම :*

රජයේ *ගැසට් පත්‍රයේ* 2023.03.13 දින පළ වී ඇති අතර, දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත්වල 2026.03.03 දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය :*

සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙළා වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසිකරු පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) ;
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000/-;
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 2,000/- ;
6. සියලුම ප්‍රචාරක වියදම්,

7. ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමඟ වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

*වැඩි විස්තර සඳහා විමසන්න :*
අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය,
ඩී.එෆ්.සී.සී. බැන්ක් පීඑල්සී,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.
දුරකථන අංක : 011 2371371.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය.

තුසිත් කරුණාරත්න,
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3,
විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 011 3068185, 011 2572940.

07-67

**ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසිය පිළිබඳ දැන්වීම

නුවරඑළියේ, ශ්‍රීමත් බණ්ඩාරනායක මාවතේ, වරිපනම් අංක 138 දරන පරිශ්‍රයේ පිහිටි පර්චස් 7.59 ක් බැගින් විශාලැති අගනා වාණිජ ඉඩමක්.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔයපළාත කෝරළේ, නුවරඑළිය ප්‍රාදේශීය මහ නගර සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ, නුවරඑළිය ග්‍රාම නිලධාරි වසමේ නුවරඑළිය නගරයේ පිහිටි ශ්‍රීමත් බණ්ඩාරනායක මාවතේ, වරිපනම් අංක 138 දරන පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු ජී. ගුනේෂ්වරන් විසින් මැන සාදන ලද 2010 ජූලි මස 30 දින අංක 311/2010 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 දරන ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ආදී සියලු දේ සමඟ,

නුවරඑළිය ප්‍රසිද්ධ නොතාරිස් එස්. ධායුමානවම් විසින් 2016 දෙසැම්බර් මස 16 වන දින සහතික කරන ලද අංක 19525, 2016 ජනවාරි මස 27 වන දින සහතික කරන ලද අංක 19600 සහ 2016 දෙසැම්බර් මස 29 දින සහතික කරන ලද අංක 20237 දරන ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම "සන්තියාස්" නමින් විලාශයෙන් හා අධිධානයේ ව්‍යාපාර කටයුතු කරගෙන යන්නාවූ සන්තියගෝ සන්තිය රාජන් *නොහොත්* සන්තියාගෙඩ සන්තියා රාජන් *නොහොත්* සන්තියාගොඩ සන්තින් රාජන් ණයකරු/උකස්කරු හැටියට පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ පිහිටි ස්ථානයේ දී,

**වර්ෂ 2026 ක් වූ අගෝස්තු මස 18 දින පෙ.ව. 11.00 ට**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

*වැඩිදුර විස්තර සඳහා :-*

2023.04.06 දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2023.02.22 දින "ද අයිලන්ඩ්", "දිවයින" හා "තිනකුරල්" යන පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීමේ මාර්ගය :-*

නුවරඑළිය පොලිස් ස්ථානයේ වටරවුමේ සිට නුවර පාරේ (බණ්ඩාරනායක මාවත) ඉදිරියට මීටර් 400ක් පමණ ගමන් කිරීමෙන් අදාළ දේපළ (සන්යාස් ඇග්‍රෝ කෙමිකල්) පාරේ වම් පස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය :* වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් 10% ද ;
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් සහ වැට් බද්ද ද ;
3. වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද;
4. සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද ;
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තු වශයෙන් රු. 1,500/- ක් ද;
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000/-ක් ද වේ.,

ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව් ඒ ඩී රාමනායක මාවතේ, අංක 73, ඩී එෆ් සී සී බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමනාකාරිණී, ණය පුනරුත්තාපන සහ අයකිරීම් ගෙන් විමසන්න.

පී.කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134,
බැද්දගාන පාර, කෝට්ටේ.
දුරකථන අංක : 011 2873656, 011 2871184, 0777672082.

07-36

---

**ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

කොළඹ 05, හැව්ලොක් පාරේ වරිපනම් අංක 112 දරන පරිශ්‍රය තුළ ගබඩා කර ඇති අගනා යන්ත්‍රෝපකරණ සහ මෙවලම් ඇතුළුව,

| *No.* | *Description* | *Quantity* |
|---|---|---|
| | | |
| 1 | Backhoe Loader-Caterpillar 428F2 | 5 |
| 2 | Backhoe Loader-Caterpillar 428F2-<br>With Braker Line | 4 |
| 3 | Excavator-Caterpillar 320D2 | 1 |
| 4 | Truck with Water Bowser | 2 |
| 5 | Crane Truck with 5 ton Crane | 3 |
| 6 | Rough Terrain Crane 50 Ton - 39m height | 1 |
| 7 | Rough Terrain Crane 25 Ton - 30m height | 1 |

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල සීමාව ඇතුළත හැව්ලොක් ටවුමේ ග්‍රාම නිලධාරි වසමේ, කොළඹ 05, හැව්ලොක් පාරේ වරිපනම් අංක 112 දරන ස්ථානයේ තබා ඇති ගබඩා කර ඇති මෙහි ඉහත දැක්වෙන සෑම සහ සියලු අමතර කොටස් මෙවලම් ආම්පන්න වර්තමානයේ හෝ මින් මතුවට කලින් කලට සවිකරණ ගබඩාකරන තබන්නට යෙදෙන සියලු සහ සෑම පිරියත යන්ත්‍රෝපකරණ සමාගම් විසින් වරින් වර ගෙන එන්නා වූ, ව්‍යාපාර කටයුතු කරගෙන යන්නාවූ, වරින් වර ගුදම් තුළ ගබඩාවෙන් ඉවත්කර ගන්නා වූ, නැවත ගෙනවිත් ගබඩා කරන්නා වූ, තබන්නා වූ සෑම සියලු වංචල දේපළ හෝ නැවත ගෙන එන්නා වූ, ඉවත් කර ගන්නා වූ ගබඩා කරන්නා වූ, සෑම සහ හෝ සියලු දේ සමග සහ ;

| | *Distinctive Number* | *Description, Model, Horse Power etc.* | *Chassis Number* | *Engine Number* |
|---|---|---|---|---|
| 1 | WP ZA-9634 | Caterpillar, 428F2, | CAT0428FJLYG02951 | CRS84715 |
| 2 | WP ZA-9630 | Caterpillar, 428F2, | CAT0428FKLYG02950 | CRS85730 |
| 3 | WP ZA-9633 | Caterpillar, 428F2, | CAT0428FJLYG02948 | CRS84719 |
| 4 | WP ZA-9631 | Caterpillar, 428F2, | CAT0428FCLYG02949 | CRS84718 |
| 5 | WP ZB-0500 | KATO, CR-250, | CRS 250-0135 | CD16-936688 |
| 6 | WP ZA-9938 | Caterpillar, 428F2, | CAT0428FALYG03103 | CRS84949 |
| 7 | WP ZA-9933 | Caterpillar, 428F2, | CAT0428FCLYG031O1 | CRS84950 |
| 8 | WP ZA-9936 | Caterpillar, 428F2, | CAT0428FCLYG03096 | CRS84941 |
| 9 | WP ZA-9937 | Caterpillar, 428F2, | CAT0428FCLYG030102 | CRS84947 |
| 10 | WP LN-9322 | Lanka Ashok Leyland, | MB1A3JWC0JRHU6122 | HWHEZ431527 |
| 11 | WP LN 9323 | Lanka Ashok Leyland, | MB1A3JWCRJRHU5745 | HWHZ431572 |
| 12 | WP LN-9651 | FUSO FJY4WLIRDSA | MEC2041CJHP048668 | 400950D004 |
| 13 | WP LN-9652 | FUSO FJY4WLIRDSA | MEC2041CJHP048668 | 400950D0048699 |
| 14 | WP LN-9653 | FUSO FJY4WLIRDSA | MEC2041041CJHP048K665 | 400950D0048696 |
| 15 | WP ZB-0138 | Caterpillar, 428F2 | CAT0428FPLY03207 | CRS85116 |

| *Distinctive Number* | *Description, Make, Model, Horse Power etc.* | *Chassis Number* | *Engine Number* |
|---|---|---|---|
| WP PK 5680 | Toyota Dual Purpose Vehicle | MR0DB8CD000121878 | 2GD-4794914 |
| WP PK 6237 | Mitsubishi Dual Purpose Vehicle KL3JYHFR | MMBJYKL30KH035269 | 4D56UAX538 |
| WP PK 5686 | Toyota Dual Purpose Vehicle GUN125R-DTTLH | MR0DB8CD600121884 | 2GD-4800440 |
| WP PK 5687 | Toyota Dual Purpose Vehicle GUN125R-DTTLH-HILUX | MR0DB8CD100121940 | 2GD-4802723 |
| 253-0009 | Toyota Dual Purpose Vehicle | LH119-0045448 | 3L-3549330 |

| *Distinctive Number* | *Description, Make, Model, Horse Power etc.* | *Chassis Number* | *Engine Number* |
|---|---|---|---|
| WP DAG 1988 | Toyota Dual Purpose Vehicle 207 RX PICKUP | MAT478018HSRI5088 | 497SP26NSY6 |
| WP ZB 2270 | Hyundai Special Purpose Vehicle HG130 MOTOR GRADER | LCL713HOAL2000344 | 82237465 |
| WP ZB 2275 | Hyundai Special Purpose Vehicle HG130 MOTOR GRADER | LCCL713HOCK200342 | 82237465 |

ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ලියනගේ විසින් 2018 මැයි මස 22 දින සහතික කරන ලද අංක 889, 897 සහ ප්‍රසිද්ධ නොතාරිස් ටී.පී. කොදාගොඩ විසින් 2022 ඔක්තෝබර් මස 05 වන දින සහතික කරන ලද අංක 848 දරන ඩීඑෆ්සීසී පීඑල්සී නමට ලියන ලද්දා වූ උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම "Sirra Coitruction Limited" ණයකරු/උකස්කරු හැටියට පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ පිහිටි ස්ථානයේ දී,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 14 දින පෙ.ව. 11.00 ට**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

*වැඩිදුර විස්තර සඳහා :-*
2023.04.06 දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2023.02.22 දින "ද අයිලන්ඩ්", "දිවයින" හා "තිනකුරල්" යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් 10% ද ;
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද සහ වැට් බද්ද ;
3. වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද;
4. සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද ;
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තු වශයෙන් රු. 1,500/-;
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000/- ක් ද වේ.,

ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමණායක මාවතේ, අංක 73, ඩී එෆ් සී සී බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමනාකාරිණී, ණය පුනරුත්ථාපන සහ අයකිරීම්ගෙන් විමසන්න.

පී.කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134,
බැද්දගාන පාර, කෝට්ටේ.
දුරකථන අංක : 011 2873656, 011 2871184, 0777672082

07-37

**ප්‍රසිද්ධ වෙන්දේසිය**

**නුගේගොඩ දිසා අධිකරණයේ දීය.**

අටළුගමගේ තිලක් සිල්වා (මියගොස්)
අංක 58, පැපිලියාන පාර, ගංගොඩවිල, නුගේගොඩ.

*- පැමිණිලිකරු -*

අටළුගමගේ අරුණ සංජීව කුමාර සිල්වා,
අංක 58, පැපිලියාන පාර, ගංගොඩවිල, නුගේගොඩ.

- ආදේශිත *පැමිණිලිකරු -*

නඩු අංකය : 75/2008/බෙදුම් (P).

*- එදිරිව-*

01. දෝන මාලිනි සේනාධීර (මියගොස්)

01. A ගල්හේනගේ නිශාන්ත ප්‍රේමතිලක පෙරේරා,
අංක 58, දෙහිවල පාර, මහරගම.

02. දොන් ලයනල් සේනාධීර,
අංක 58, දෙහිවල පාර, මහරගම.

03. දෝන රම්පාල සේනාධීර (මියගොස්)

03. A වීරක්කොඩිගේ දෝන අනුලාවතී.
අංක 58, දෙහිවල පාර, මහරගම.

04. ගල්හේනගේ නිශාන්ත ප්‍රේමතිලක පෙරේරා,
අංක 58, දෙහිවල පාර, මහරගම.

05. මොහොමඩ් හුසයින් පවුම් හුසයින්,
අංක 32/1, පැලස් පාර, බේරුවල ;

සහ තවත් අය

*- විත්තිකරුවන් -*

ඉහත අංක දරන නඩුවේ මා වෙත නිකුත් කරන ලද විකිණීමේ අධිකාරි පත්‍රයේ නියෝගයන්ට අනුව මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2026ක් වූ ජුලි මස 21 වන දින පෙ.ව. 11.00ට එකී දේපළ පිහිටි ස්ථානය වන ගොඩිගමුව යන ගම පිහිටි "ජම්බුගහවත්ත' කියන වරිපනම් අංක 52, 54 සහ 54/1 දරන (ආසිරි බර්ගර් සහ ප්‍රේස්ට්‍රි ෂොප්) තෙමහල් ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, ගොඩිගමුව යන ගම පිහිටි "ජම්බුගහවත්ත" කියන වරිපනම් අංක 52, 54, සහ 54/1 දරන ඉඩමෙහි බලයලත් මිනින්දෝරු එම්. අනිල් පීරිස් මානක තැන විසින් මැන සාදන ලද අංක 744 දරන ප්ලැනෙහි (ගල්කිස්ස දිසා අධිකරණයේ අංක 12620 දරන බෙදුම් නඩුවේ අවසාන බෙදීම) අංක 03 ලකුණු කර බෙදා වෙන් කරන ලද කොටස නැවත මැන බලයලත් මානක එම්. එම්. එස්. ප්‍රනාන්දු මහතා විසින් වර්ෂ 2003 ක් වූ

දෙසැම්බර් මස 07 වන දින සාදන ලද අංක 781 දරන පිඹුරේ ලොට් 3ජ් දරන බිම් කොටසට මායිම්, උතුරට : එකී ප්ලැනයේ අංක 02 දරන එම ඉඩමෙන් කොටසක් ද, නැගෙනහිරට : දෙහිවල පාර ද, දකුණට : එකී ප්ලැනයේ අංක 4 දරන බිම් කොටස ද, බස්නාහිරට : ඩී. එල්. වීරකෝන් හිමිකම්පාන ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්. 7.35 විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ.

***දේපළට පිවිසීම :***
මහරගම නගර මධ්‍යයේ සිට දෙහිවල දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ මහරගම පොළ පසුකොට ගමන් කිරීමේ දී වම් පැත්තේ පිහිටි කාගිල්ස් ෆුඩ් සිටි ආයතනය ඉදිරිපිට, නිව් ප්‍රේමසිරි සේල් සෙන්ටර් සහ අතුරලිය ජුවලර්ස් යන ආයතනයන්ට මැදිව මහරගම දෙහිවල මාර්ගයට මුහුණලා ආසිරි බර්ගර් ඇන්ඩ් පේස්ට්‍රි ෂොප් යනුවෙන් සඳහන් නාම පුවරුවක් සහිත තුන් මහල් ගොඩනැගිල්ල සහිත මෙම දේපළ පිහිටා ඇත.

***ගෙවීමේ ක්‍රමය :***
වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය ;
(චෙක්පත් භාරගනු නොලැබේ.)

1. විකුණුම් මුදලින් 25% (සියයට විසිපහක්) ද ;
2. ගැසට් පත්‍රයේ සහ පුවත්පත් දැන්වීම් ගාස්තු සහ සියලුම ප්‍රචාරක ගාස්තු ද ;
3. වෙන්දේසිකරුගේ ගාස්තු (විකුණුම් මිලෙන් 2 1/2) ද;
4. ලිපිකරු හා සෝෂකගේ ගාස්තු ද ;
5. පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු ගාස්තු ;

ඉතිරි සියයට හැත්තෑපහක (75%) ක මුදල දින 30ක් ඇතුළත නුගේගොඩ දිසා අධිකරණයේ ඉහත අංක 75/2008 බෙදුම් (P) නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය. එසේ ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, මුලින් තැන්පත් කරන ලද මුදල් ආපසු නොගෙවන අතර, එකී දේපළ නැවත වෙන්දේසියේ තැබීමට ක්‍රියා කරනු ඇත.

අධිකරණයේ අණ පරිදි,

**හේමචන්ද්‍ර දළුවත්ත,**
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු හා තක්සේරුකරු.

අංක 61/1,
ප්‍රගති මාවත,
බංගලාවත්ත, කොට්ටාව.
ඇමතුම් : 071 417 5944/ 071 694 5494
විද්‍යුත් තැපැල : daluwattahd@gmail.com

07 - 97

---

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

**ගාල්ල දිසා අධිකරණයේ දී ය.**

කොළඹ 01, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත, අංක 21, දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. සහ නෙළුව පැලවත්ත පාර ඇපා ගොඩනැගිල්ලේ "නෙළුව" ශාඛාව යනුවෙන් සඳහන් කරනු හා හඳුන්වනු ලබන ශාඛා කාර්යාලයක් සහ හෝ ව්‍යාපාර ස්ථානයක් ඇත්තේ ය.

*- පැමිණිලිකරු -*

නඩු අංකය : 3260/MB
වටිනාකම : රු. 2,044,336.47
ස්වභාවය : උකස්කරය
කර්ය පටිපාටිය : සාමාන්‍යය

- විරුද්ධව -
01. කෝරලේ හේවගේ දයාරත්න
02. වික්‍රමනායක කරුණාරත්න එරන්දි වාසනා දෙදෙනාම
1 වන පියවර, හල්විටිගල ජනපදය, ගාල්ල

*- විත්තිකරුවන් -*

වර්ෂ 2021 ක් වූ මාර්තු මස 08 වන දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද නඩු තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

1(අ) පැමිණිල්ලේ ආයාචනනයේ (අ) ඡේදයේ අයැද ඇති ඉහත කී නඩු නිමිත්ත මත ගෙවීමට තිබෙන මුල් මුදල වශයෙන් රුපියල් 1,815,234.17 ක මුදලක් ද එකී ගෙවීමට තිබෙන මුල් මුදල මත 2018.10.31 දින දක්වා රුපියල් 229,102.30 ක පොළිය ද, එකී ගෙවීමට ඉතිරිව තිබෙන මුල් මුදල වන රුපියල් 1,815,234.17 ක මුදල මත 2018.11.01 දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 16% බැගින් වැඩිදුර පොළියක් ද සමග 1 වන සහ 2 වන විත්තිකරුවන්ට පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු බවට මෙයින් නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද ;

තීන්දු ප්‍රකාශයේ සහ මෙහි පහත උපලේඛනයෙහි විස්තර කර ඇති සම්පූර්ණ බිම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි සහ ඊට අයත් හෝ අදාළ මාර්ග අයිතිවාසිකම් ඇතුළත් සියලුම අයිතිවාසිකම් ද, එකී බිම් කොටසකට සහ බිම් කොටසින් විත්තිකරුවන්ගේ සියලුම බුදල් අයිතිවාසිකම් ද හිමිකම් ද දේපළ හිමිකම් පෑම් සහ ඉල්ලීම් ද ඉහත කී නඩු නිමිත්ත මත ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් 2016.04.07 දින දරන ප්‍රාථමික උකස්කරය යටතේ සහ පරිදි ඉහත කී මුදල් ප්‍රමාණයන් අයකර ගැනීම සඳහා බන්ධනය වී ඇති බව සහ ඇස්කීසි කළ හැකි බව ද එකී නඩු නිමිත්ත මත එකී මුදල් ප්‍රමාණයන් අයකර ගැනීම පිණිස එකී උකස්කරය බලාත්මක කිරීමට පැමිණිලිකරුට හිමිකම් ඇති බවට ද මෙයින් නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද ;

තව ද විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට මෙම නඩුවේ තක්සේරු නඩු ගාස්තු ගෙවිය යුතු බව ද මෙයින් නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

ඉහත සඳහන් නඩුවේ විත්තිකරුවන් මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් මෙම නඩුවේ පැමිණිලිකරුට අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා පහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී,

**වර්ෂ 2026 ක් වූ අගෝස්තු මස 14 දින ප.ව. 1.30ට,**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හිනිදුම් පත්තුවේ, තවලම ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවේ, හල්විටිගල ජනපද පියවර 1 අංක 228 බී දරන ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි බතලගලකන්ද නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ආර්. විදානපතිරණ විසින් මැන බෙදා වෙන් කරන ලද 2016.02.20 දින දරන අංක 1605 දරන පිඹුරේ නිරූපිත ( කලින් මිනින්දෝරුපති විසින් FAP 485 ලෙස සහතික කරන ලද කැබලි අංක 176 දරන බිම් කැබැල්ල සඳහා මායිම් වන්නේ උතුරට එකී ඉඩමේම කැබලි අංක 174, 177 සහ 179; නැගෙනහිරට : එකී ඉඩමේම කැබලි අංක 177; දකුණට : ප්‍රාදේශීය සභා පාර සහ එම ඉඩමේම කැබලි 175 සහ 215 1/2; බස්නාහිරට : එම ඉඩමේම කැබලි අංක 174 සහ 175 මායිම් වූ එකී අංක 176 දරන කැබැල්ල ප්‍රමාණයෙන් රූඩ් දෙකයි, පර්චස් එකොළහයි (රූ.2, පර්. 11) සියලු ගොඩනැගිලි සහ ගහකොළ සහ ඒ මත සියලු දෑ ඇතුළත් ය.

මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO W 5/68 හි ලියා පදිංචි කර ඇත.

*දේපළට පිවිසීම :-*

කොළඹ සිට උඩුගම ගාල්ල පොදු මාර්ගයේ තවලම හන්දිය දක්වා කිලෝ මීටර් 07ක් පමණ ගමන් කර, අකුරැස්ස මාර්ගයෙන් වමට හැරී 7 වන සැතපුම් කණුව හංදිය දක්වා කිලෝමීටර් 05ක් පමණ ගමන් කර හල්විටිගල පොදු මාර්ගයෙන් වමට හැරී කිලෝ මීටර් 03ක් පමණ (රුවන්පුර හන්දියෙන් වමට හැරී) කලබොඩ කඩේ ලෙස හැඳින්වෙන හංදිය දක්වා ගමන් කර බංගලා කන්ද පාර ලෙස හැඳින්වෙන හංදිය දක්වා ගමන් කර, බංගලා කන්ද පාර ලෙස හැඳින්වෙන ප්‍රාදේශීය සභා පාරෙන් වමට හැරී ඉන්පසු පාර අවසානය දක්වා මීටර් 450ක් පමණ ගමන් කළ විට දේපළ ප්‍රවේශ පාර අවසානයේ දකුණු අතට පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය :-*

වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.
(චෙක්පත් භාරගනු නොලැබේ.) :-

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ක්
2. නොතාරිස් ගාස්තු, ගමන් ගාස්තු සහ විකිණීමේ ගාස්තු සකස් කිරීමේ ගාස්තු රු. 10,500/-;
3. සියලුම ප්‍රචාරක වියදම්;
4. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු (C.P.C. 258 වන වගන්තිය අනුව) ;
6. ලිපිකරු බෙරකරු හා සෝෂක ගාස්තු රු. 4,500/- ;
7. ගැනුම් මිලෙන් ඉතිරි 75% ක මුදල දින 30ක් ඇතුළත දී ගාල්ල දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතුය.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ තක්සේරුකරු,
උසාවි කොමසාරිස්, වාණිජ මහාධිකරණ සහ කොළඹ
දිසා අධිකරණය, ගාල්ල දිසා අධිකරණයේ බලයලත්
වෙන්දේසිකරු, රාජ්‍ය හා වාණිජ බැංකු.

අංක 7/1/10,
1 වන මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙකස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංක : 011 2396520, 077 3242954.

සමරරත්න ඇසෝසියේටඩ්,
නීතිඥවරු සහ නොතාරිස්වරු,
අංක 810,
මරදාන පාර,
කොළඹ 10.
දුරකථන අංක 011 22672262
ෆැක්ස් අංක : 011 2683073.3

07 - 75

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

**කොළඹ දිසා අධිකරණයේ දී ය.**

1 කැනැතිගොඩ ගමගේ පීටර් පෙරේරා (මියගොස්)
අංක 127, ආදර්ශ ගොවිපල පාර, බොරැල්ල.

1A ගලගෙදරගේ දෝන සිරියාවති (මියගොස්)
අංක 127, ආදර්ශ ගොවිපල පාර, බොරැල්ල.

7A වඩුසිංහ ආරච්චිගේ අශෝකා (මියගොස්)
අංක 554/6, සඟබෝ මාවත, මාකොළ උතුර,
මාකොළ.

1A (A) නදීක සමින්ද වඩුසිංහ ආරච්චි,
අංක 9/1, තැඹිලිගස්මුල්ල පාර,
මාකොළ උතුර, මාකොළ.

2 කැනැතිගොඩ ගමගේ ලීලාවතී පෙරේරා (මියගොස්)
අංක 131/57, ආදර්ශ ගොවිපල පාර, බොරැල්ල.

2A නිහාල් ශාන්ත කුමාර පෙරේරා පැටිකිරි,
අංක 194/ඊ/2/20, මැල්වත්ත,
සියඹලාගොඩ උතුර,
පොල්ගස්ඕවිට.

3 කැනැතිගොඩ ගමගේ ඇනී පෙරේරා (මියගොස්)
අංක 22/9, වික්‍රමසිංහපුර තලවතුගොඩ,
තලංගම දකුණ,
බත්තරමුල්ල.

3A ජයසිංහ ආරච්චිගේ ස්වර්ණා සුවිනීතා කාන්ති හේරත්,
අංක 22/9, වික්‍රමසිංහපුර,
බත්තරමුල්ල.

4 කැනැතිගොඩ ගමගේ සොපායා පෙරේරා (මියගොස්)
අංක 47/11, පළමු පටුමග,
මැද වැලිකඩ, රාජගිරිය

4A වටවල කංකානම්ගේ සයිමන් පෙරේරා (මියගොස්)
4A1 වටවල කංකානම්ගේ දෝන ජයන්ති රෝහිණී පෙරේරා,
අංක 47/11, පළමුවන පටුමග,
මැද වැලිකඩ, රාජගිරිය.

5 කැනැතිගොඩ ගමගේ හේමාවතී පෙරේරා (මියගොස්)
අංක 47/10, පළමුවන පටුමග,
මැද වැලිකඩ, රාජගිරිය.

5A ගාමිණී රාජා වඩුසිංහආරච්චි,
අංක 39, අතුරුගිරිය පාර, කොට්ටාව,
පන්නිපිටිය.

6 කැනැතිගොඩ ගමගේ කරලැයින් පෙරේරා (මියගොස්)
අංක 140/62, පල්ලිය පාර,
බ්‍රැන්ඩියමුල්ල, ගම්පහ.

6A දොන් ජයවර්ධන අප්පුහාමිලාගේ සිසිර කුමාර ජයවර්ධන,
අංක 62, පල්ලිය පාර,
බ්‍රැන්ඩියමුල්ල, ගම්පහ.

6B ගාමිණී රාජා වඩුසිංහආරච්චි,
අංක 39, අතුරුගිරිය පාර,
කොට්ටාව, පන්නිපිටිය.

7 වඩුසිංහ ආරච්චිගේ එඩ්වඩ් ද සිල්වා (මියගොස්)

7A වඩුසිංහ ආරච්චිගේ අශෝකා (මියගොස්)
අංක 554/6, සහබෝ මාවත,
මාකොළ උතුර, මාකොළ.

7A(A) නදීක සමින්ද වඩුසිංහආරච්චි,
අංක 9/1, තැඹිලිගස්මුල්ල පාර,
මාකොළ උතුර, මාකොළ.

8 වඩුසිංහ ආරච්චිගේ අශෝකා (මියගොස්)
අංක 554/6, සහබෝ මාවත,
මාකොළ උතුර, මාකොළ.

8A නදීක සමින්ද වඩුසිංහ ආරච්චි,
අංක 9/1, තැඹිලිගස්මුල්ල පාර,
මාකොළ උතුර, මාකොළ.

9 ලංකා තිස්ස වඩුසිංහ ආරච්චි
අංක 554/6, සහබෝ මාවත,
මාකොළ උතුර, මාකොළ.

10 ගාමිණී රාජා වඩුසිංහ ආරච්චි,
අංක 39, අතුරුගිරිය පාර,
කොට්ටාව, පන්නිපිටිය.

11 ජයගම ආරච්චිගේ රූපා විමලාවතී පෙරේරා (මියගොස්)
අංක 194/2, රාජගිරිය පාර,
රාජගිරිය.

11A ජයගම ආරච්චිගේ මල්ලිකා ලලිතා පෙරේරා,
අංක 192, රාජගිරිය පාර,
රාජගිරිය.

11B ජයගම ආරච්චිගේ සිරියාවතී රාණි පෙරේරා
අංක 131/33, මොඩල් ෆාම් පාර, බොරැල්ල.

12 ඔල්වින් සමරකෝන්
13 මියුරින් සමරකෝන්,
දෙදෙනාම : අංක 1/7, මහවත්ත පාර,
මිරිහාන, නුගේගොඩ.

14. මහින්ද කුරුප්පුආරච්චි

15. විපුල කුරුප්පු ආරච්චි,
දෙදෙනාම : අංක 119/12, ආදර්ශ ගොවිපල පාර,
බොරැල්ල.

16 පීටර් සේරම් (මියගොස්)

16A එදිරිසූරිය මොහොට්ටිගේ චන්ද්‍රවතී ද සේරම්,
අංක 363, මහවත්ත පාර,
මිරිහාන, නුගේගොඩ.

17 නැන්සි සමරකොන් (මියගොස්)

17A මියුරින් සමරකෝන්
අංක 1/7, මහවත්ත පාර,
මිරිහාන පාර, නුගේගොඩ.

18 පතිරුන්නැහැලාගේ ඇග්නස් පෙරේරා (මියගොස්)

18A සෝලංග ආරච්චිගේ දොන් කරුණානන්ද,

18B සෝලංග ආරච්චිගේ රත්නලතා ගුණසීලි පෙරේරා,
අංක 266/3, කොටිකාවත්ත,
අංගොඩ.

19 පතිරුන්නැහැලාගේ සෝමදාස පෙරේරා (මියගොස්)

19A පතිරුන්නැහැලාගේ සුනන්දා ලක්ෂ්මී පෙරේරා

19B පතිරුන්නැහැලාගේ ඉන්ද්‍ර ඩල්සි පෙරේරා

19C පතිරුන්නැහැලාගේ පාලිත ඉන්ද්‍රදේව පෙරේරා

19D පතිරුන්නැහැලාගේ පද්මලාල් පෙරේරා,
අංක 266/3, කොටිකාවත්ත,
අංගොඩ.

20 පතිරුන්නැහැලාගේ ගුණදාස පෙරේරා (මියගොස්)

20A පතිරණගේ ඉන්ද්‍රානි පෙරේරා

20B පතිරන්නැහැලාගේ ප්‍රියාමනී පෙරේරා,
අංක 266/3, කොටිකාවත්ත,
අංගොඩ.

21 පතිරන්නැහැලාගේ මදුරාවතී පෙරේරා

22\. පතිරන්නැහැලාගේ ලීලාවතී පෙරේරා,
<u>දෙදෙනාම</u> : අංක 119/4, ආදර්ශ ගොවිපළ පාර,
බොරැල්ල.

23 ධර්මසේන ප්‍රේමචන්ද්‍ර රණසිංහ,

24 ලීලාවතී අමරා රණසිංහ,
<u>දෙදෙනාම</u> : අංක 23,
වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

25 කොන්ද ගමගේ ලූෂන් ග්‍රේරෝ (මියගොස්)

25A කොන්ද ගමගේ උත්පලා සමන්ති ග්‍රේරෝ,
අංක 92/A2,
කඳුබොඩ, දෙල්ගොඩ.

26 කොන්ද ගමගේ ග්‍රේස් ග්‍රේරෝ (මියගොස්)

26A ජාමුණි කාංචනා හර්ශණී ද සිල්වා,
අංක 113, ආදර්ශ ගොවිපළ පාර,
බොරැල්ල.

27 කොන්ද ගමගේ කමලා ග්‍රේරෝ (මියගොස්)

27A කොන්ද ගමගේ උත්පලා සමන්ති ග්‍රේරෝ,
අංක 92/A2,
කඳුබොඩ, දෙල්ගොඩ.

28 කොන්ද ගමගේ කල්‍යානවතී ග්‍රේරෝ,
සියලුදෙනාම : අංක 113,
ආදර්ශ ගොවිපළ පාර,
බොරැල්ල.

29 ජයගම ආරච්චිගේ සයිමන් පෙරේරා (මියගොස්)
අංක 113, ආදර්ශ ගොවිපල පාර,
බොරැල්ල.

29A කොන්ද ගමගේ කමලා ග්‍රේරෝ (මියගොස්)
කොන්ද ගමගේ උත්පලා සමන්ති ග්‍රේරෝ,
අංක 92/A2, කඳුබොඩ,
දෙල්ගොඩ.

...................... *පැමිණිලිකරුවන්* -

*නඩු අංකය* : 15109/බෙ.
*වර්ගය* : බෙදුම්
*කාර්ය පටිපාටිය* : සාමාන්‍ය
*වටිනාකම* :

- *එදිරිව* -

01. ජයමහ මුදලිගේ දොන් සුගතපාල (මියගොස්)

01A ජයමහ මුදලිගේ දොස් මාලනී ශ්‍රීමතී (මියගොස්)

01A1 සුදේශ් ලක්ෂ්මන් ජයදේව හෙට්ටිආරච්චි

2. ජයමහ මුදලිගේ දොන් මාලනී ශ්‍රීමතී (මියගොස්)

2A සුදේශ් ලක්ෂ්මන් ජයදේව හෙට්ටිආරච්චි

3. ජයමහ මුදලිගේ දොන් ලයනල් (මියගොස්)

3A කොස්වත්ත ගමගේ ලීලාවතී

4. ජයමහ මුදලිගේ දොන් තිස්ස

5. ජයමහ මුදලිගේ දොන් ෂෙල්ටන් *හෙවත්*
ජයමහ මුදලිගේ දොන් ෂෙල්ටන් ධර්මරත්න
(මියගොස්)

5A ජයමහ මුදලිගේ දොන් සුදත් නිශාන්ත,
සියල්ලෝම : අංක 131/55,
ආදර්ශ ගොවිපල පාර, බොරැල්ල.

6. කැනැතිගොඩ ගමගේ සැලී පෙරේරා,
අංක 131/54, අදර්ශ ගොවිපල පාර,
බොරැල්ල.

7. කැනැතිගොඩ ගමගේ සීබල් පෙරේරා (මියගොස්)

7A ලියනගේ ගාමිණී සුරේන්ද්‍ර පෙරේරා,
අංක 131/48, ආදර්ශ ගොවිපල පාර,
බොරැල්ල.

8. කැනැතිගොඩ ගමගේ ඩොටී පෙරේරා,
අංක 131/54, අදර්ශ ගොවිපල පාර,
බොරැල්ල.

9. කැනැතිගොඩ ගමගේ ඩොලී පෙරේරා (මියගොස්)

9A ශ්‍රියාණි විජේසේකර,
අංක 47, සොමි මැදුර,
හොන්නන්තර, පිළියන්දල.

10. කැනැතිගොඩ ගමගේ ඇසිලින් පෙරේරා (මියගොස්)

10A මහබාලගේ දෝන ශ්‍රියානි කුසුම් ජයවර්ධන,
අංක 94/4, මල්පුර පාර, කොටිකාවත්ත,
අංගොඩ.

11. කැනැතිගොඩ ගමගේ සුසන් පෙරේරා (මියගොස්)

11A ලියනගේ ශාන්ති පෙරේරා

12. කැනැතිගොඩ ගමගේ ලීට් පෙරේරා

12A ලියනගේ ශාන්ති පෙරේරා,
සියල්ලෝම : අංක 131/54,
ආදර්ශ ගොවිපළ පාර, බොරැල්ල.

13 කාරියප්පෙරුම අතුකෝරලලාගේ සීලී පෙරේරා
(මියගොස්)

13A කැනැතිගොඩ ගමගේ ලීලාවතී පෙරේරා,
අංක 131/54, ආදර්ශ ගොවිපල පාර,
බොරැල්ල.

14. කාරියප්පෙරුම අතුකෝරලලාගේ සරත් නන්දසිරි
(මියගොස්)

14A ලියනගේ ශාන්ති පෙරේරා

14B කැනැතිගොඩ ගමගේ සුමාලි ධනුෂ්කා පෙරේරා

14C කැනැතිගොඩ ගමගේ ගන්දීමා සෙව්වන්දි පෙරේරා

15 කාරියප්පෙරුම අතුකෝරළලාගේ තනිල් බන්දුල

16. කාරියප්පෙරුම අතුකෝරළලාගේ ලීලාවතී
සියල්ලෝම : අංක 131/48,
ආදර්ශ ගොවිපළ පාර, බොරැල්ල.

17. ජයගම ආරච්චිගේ සිරියාවතී රාණි පෙරේරා,
අංක 121/C, මත්තෙගොඩ නිවාස යෝජනා ක්‍රමය,
කොට්ටාව.

18. ජයගම ආරච්චිගේ මල්ලිකා ලලිතා පෙරේරා,
අංක 194/1, රාජගිරිය පාර,
රාජගිරිය.

19. ජයගම ආරච්චිගේ ජයරත්න *නොහොත්*
ආනන්ද පෙරේරා

20. ජයගම ආරච්චිගේ සිරියාවතී පෙරේරා
21. ජයගම ආරච්චිගේ මල්ලිකා පෙරේරා

22. ජයගම ආරච්චිගේ මාලනී පෙරේරා

23. ජයගම ආරච්චිගේ පද්මා පෙරේරා,
සියල්ලෝම : අංක 131/25,
ආදර්ශ ගොවිපළ පාර, බොරැල්ල.

24. සමරකෝන් ආරච්චිගේ බාරෝන් (මියගොස්)

25. විල්ප්‍රඩ් සමරකෝන් (මියගොස්)

25A සමරකෝන් ආච්චිගේ සුනිල් හේමන්ත
සමරකෝන්,
අංක 14/1, 1 වන පටුමග,
අපේක්ෂා රෝහල පාර, මහරගම.

26. එල්. ශාන්ති පෙරේරා (මියගොස්)
අංක 131/54, ආදර්ශ ගොවිපළ පාර,
බොරැල්ල.

26A කැතිගොඩ ගමගේ සුමාලි ධනුෂ්කා පෙරේරා,
අංක 728/1C, 6 වන පටුමග,
කෙරේමුල්ල පාර,
පනාගොඩ, හෝමාගම

*.......................විත්තිකරුවන් -*

ඉහත අංක දරන බෙදුම් නඩුවට අදාළව **වර්ෂ 2021 ක් වූ මාර්තු මස 13 වන දින** ඇතුළත් කර ඇති අතුරු තීන්දු ප්‍රකාශය අනුව, විස්තර කර ඇති ඉඩමට හා ස්ථානයට ඉහත නම් සඳහන් පැමිණිලිකරුවන්ට සහ විත්තිකරුවන්ට එහි ලා දක්වා ඇති කොටස් අනුව හිමිකම් ලැබිය යුතු බවට ද ඔවුන් එමගින් හිමිකම් ලබන බවට ද ප්‍රකාශයට පත් කරනු ලැබූ බවට තීන්දු ප්‍රකාශ කර ඇත.

ඒ අනුව, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, නාරාහේන්පිට අංක 34 වන කොට්ඨාසයේ, මොඩල් ෆාම් පාරේ පිහිටි වරිපනම් අංක 131/54 සහ 131/55 දරන ස්ථානයේ පිහිටි මෙහි පහත (1) වන උපලේඛනයේ සඳහන් දේපළ, (2) උපලේඛනයේ සඳහන් පරිදි මූලික මැනීම අනුව විශාලත්වයෙන් පර්චස් විසි අටයි දශම එකයි නවයයි (පර්. 28.19) ක් වන ඉඩම් කොටස ඉහත කී සංශෝධිත අතුරු තීන්දු ප්‍රකාශය පරිදි, අදාළ විෂය වස්තුව බෙදා වෙන් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් බෙදු පනතේ ප්‍රතිපාදන මත වෙන්දේසිකාර පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් මත හිමිකම් ලබා දීමට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද, ඉහත කී දේපළෙහි සංශෝධිත තක්සේරු වාර්තාව සම්බන්ධයෙන් කිසිදු පාර්ශ්වකරුවකුගෙන් විරෝධතාවක් ඉදිරිපත් නොවූ හෙයින් ද ;

එකී කොළඹ දිසා අධිකරණයෙන් මා වෙත නිකුත් කර ඇති සංශෝධිත විකිණීමේ අධිකාරි පත්‍රයේ බලයපිට, ඉහත කී මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි සියලු දේ.

**වර්ෂ 2026ක් වූ ජූලි මස 28 වන දින පෙ.ව. 09.30ට**

එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**1 වන උපලේඛනය (පැමිණිල්ල අනුව)**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, නාරාහේන්පිට අංක 34 වන කොට්ඨාසයේ, මොඩල් ෆාම් පාරේ පිහිටි වරිපනම් අංක 131/54 සහ 131/55 දරන "පල්ලියගොඩ ගොරකගහවත්ත" නම් බෙදා වෙන් කළ ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු ජේ. පී. කම්මානන්කඩ මහතා විසින් වර්ෂ 1990 ක් වූ මැයි මස 31 වන දින මැන සාදන ලද අංක 907 දරන පිඹුර ප්‍රකාරව මායිම් : උතුරට : වරිපනම් අංක පී 131 දරන ඉඩම ද; නැගෙනහිරට : මොඩල් ෆාම් පාරේ වරිපනම් අංක 131/40, 131/41, 131/42 සහ 131/53 දරන ඉඩම් ද; දකුණට : වරිපනම් අංක 185/4 දරන ඉඩම ද; සහ බස්නාහිරට : වරිපනම් අංක 171/5 දරන ඉඩම සහ වරිපනම් අංක ජී 131 දරන ඉඩම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසි හතයි දශම හය (පර්.27.6) ක් විශාල ඉඩම වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 817/133 පත් ඉරුවේ ලියාපදංචි කර ඇත.

**ඉහත කී දෙවන උපලේඛනය (මූලික මැනීම අනුව)**

ඉහත කී ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ඩී. ජී. විජයරත්න මහතා විසින් වර්ෂ 1992 ක් වූ ජනවාරි මස 08 වන දින කරන ලද නැවත මැනීමක දී පහත සඳහන් පරිදි විය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1, ගෝතමීපුර ග්‍රාම නිලධාරි වසම තුළ, අංක 34 දරන නාරාහේන්පිට කොට්ඨාසයේ, ආදර්ශ ගොවිපල පාරේ පිහිටි වරිපනම් අංක 131/54 සහ 131/55 දරන "පල්ලියගොඩ ගොරකගහවත්ත" නම් ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ඩී. ජී. විජයරත්න මහතා විසින් වර්ෂ 1992 ක් වූ ජනවාරි මස 13 වන දින අංක 512 දරන මූලික පිඹුර ප්‍රකාරව මායිම්: උතුරට : ආදර්ශ ගොවිපල පාරේ වරිපනම් අංක ජී 131 දරන ඉඩම ද; නැගෙනහිරට : ආදර්ශ ගොවිපළ පාරේ වරිපනම් අංක 131/40, 131/41, 131/42 සහ 131/53 දරන ඉඩම් ද; දකුණට : ආදර්ශ ගොවිපළ පාරේ වරිපනම් අංක 185/4 දරන ඉඩම ද; සහ බස්නාහිරට : ආදර්ශ ගොවිපල පාරේ වරිපනම් අංක 171/5 දරන ඉඩම සහ වරිපනම් අංක ජී 131 දරන ඉඩම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසි අටයි දශම එකයි නවයයි (පර්.28.19) ක් විශාල ඉඩම වේ.

***දේපළට පිවිසීම :-***

කොළඹ 08, බොරැල්ල සේනානායක හන්දියේ සිට කාසල් වීදිය ඔස්සේ මීටර් 400ක් පමණ ගමන් කළ විට දකුණු පසින් හමුවන දේවී බාලිකා විද්‍යාලය හා කොළඹ කනත්ත මැදින් වැටී ඇති මොඩල් ෆාම් පාර (පූජ්‍ය පැල්පොල විපස්සී මාවතේ) ගමන් කළ විට හමුවන දුම්රිය මාර්ගය ද පසුකර මීටර් 50ක් පමණ ඉදිරියට ගමන් කළ විට වම් පසින් හමුවන තැපැල් පෙට්ටිය අසලින් වමට හැරී තවත් මීටර් 25ක් පමණ ගමන් කළ විට හමුවන වංගුව ඉදිරියේ දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

***ගෙවීමේ ක්‍රමය :-***

වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් සියයට විසිපහක් (25%) ද ;
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් සියයට එක (1%) ක් ද ;
3. දේපළෙහි තක්සේරු වටිනාකමින් සියයට බිංදුවයි දශම පහ (0.5%) ක් වූ තක්සේරු ගාස්තු ද;
4. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු වශයෙන් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද ;
5. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද ;
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ද ;
7. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව ද එවෙලේම මුදලින් ගෙවිය යුතුයි.

තව ද, ගැනුම් මිලෙන් සියයට හැත්තෑ පහ (75%) ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින තිහක් (30) ඇතුළත ඉහත කී අධිකරණයේ තැන්පත් කළ යුතු අතර, ඒ සඳහා පිළිගත හැකි ඇපකරුවන් දෙදෙනකු එම අවස්ථාවේ දී ඉදිරිපත් කරමින් විකුණුම් කොන්දේසි අත්සන් තැබිය යුතු ය.

**කේ. පී. එන්. සිල්වා (සා.වි.)**
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

අංක 501/10,
ධර්මපාල මාවත, කලපළුවාව පාර,
අග්ගොන, අංගොඩ.
දුරකථන අංක : 011 2868872, 077 8441812
ඊමේල් : premalalnsilva@gmail.com

07 -116

**ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි**

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2026 වර්ෂය** | | | |
| **ජූලි** | 2026.07.03 | සිකුරාදා | 2026.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.10 | සිකුරාදා | 2026.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.17 | සිකුරාදා | 2026.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.24 | සිකුරාදා | 2026.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.31 | සිකුරාදා | 2026.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2026.08.07 | සිකුරාදා | 2026.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.14 | සිකුරාදා | 2026.07.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.21 | සිකුරාදා | 2026.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.28 | සිකුරාදා | 2026.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2026.09.04 | සිකුරාදා | 2026.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.09.11 | සිකුරාදා | 2026.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.09.18 | සිකුරාදා | 2026.09.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.09.25 | සිකුරාදා | 2026.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.